# Express Mail Service (EMS)

## User Guide (Postal Staff)

**(March, 2026)**

**International Postal Services Division**
**Department of Posts**
**Sri Lanka**

**Tele : 011-2320017, 011-2328301 (Ext.1201)**
**Email : supdt.ips@slpost.lk**

# පටුන


| | මාතෘකාව | පිටුව |
|---|---|---|
| 1 | හැඳින්වීම | 01 |
| 1.1 | අත්පොත | 01 |
| 1.2 | EMS සේවාව | 02 |
| 2 | ප්‍රමිතීන් (Standards) | 03 |
| 2.1 | ක්‍රියාත්මක වන ගමනාන්ත (Destinations) | 04 |
| 2.2 | තහනම් භාණ්ඩ හා රෙගුලාසි සහිත භාණ්ඩ | 05 |
| 2.2.1 | තහනම් භාණ්ඩ (Prohibited) | 05 |
| 2.2.2 | රෙගුලාසි සහිත භාණ්ඩ (Restricted) | 06 |
| 2.2.3 | සහතික (Certificates), බලපත්‍ර (Licenses), ඉන්වොයිස් (Invoices) හා නිර්දේශ (Recommendations) | 07 |
| 2.2.4 | ගුවන් මඟින් ගෙන යාම සඳහා ශ්‍රී ලංකා තැපැල විසින් භාර නොගන්නා භාණ්ඩ / අන්තරායදායක භාණ්ඩ (Dangerous Goods) | 08 |
| 2.3 | ප්‍රමාණය හා බර | 09 |
| 2.3.1 | ප්‍රමාණය, බර හා ඇසුරුම සඳහා වන විශේෂ උපදෙස් | 11 |
| 2.4 | ලිපිනය ලිවීම | 12 |
| 2.4.1 | පොදු කරුණු | 12 |
| 2.4.2 | ලබන්නා (ලිපි හිමි) ගේ ලිපිනය | 12 |
| 2.4.3 | Postcode / Zipcode | 13 |
| 2.4.4 | ලිපිනයන් ලිවීමේදී සිදුවන වැරදි | 13 - 14 |
| 3 | තැපැල් ගාස්තු ගණනය කිරීම (Postage) | 15 |
| 4 | භාණ්ඩ භාර ගැනීම | 16 |
| 4.1 | CN23 පෝරම හා EMS barcode ලේබල් කළමනාකරණය | 16 |
| 4.2 | CN23 පෝරමය පිරවීම. | 16 - 19 |
| 4.3 | CN23 EMS පිටපත් සඳහා ක්‍රියා කල යුතු ආකාරය | 19 |
| 4.4 | EMS Barcode භාවිතය | 20 |
| 5 | EMS භාණ්ඩ ආපසු එවීම. (Return) | 21 |
| 5.1 | මෙරට තුළ දීම ආපසු එවිය හැකි අවස්ථා. | 21 |
| 5.2 | ගමනාන්ත රටට ගොස් ආපසු එවිය හැකි අවස්ථා | 21 |
| 5.3 | ආපසු එවීම් සඳහා ගාස්තු අය කරන රටවල් ලැයිස්තුව සහ අය කරන ගාස්තු ප්‍රමාණය. | 21 - 23 |
| 6 | EMS භාණ්ඩ වෙනත් ලිපිනයකට හරවා යැවීම (Re-Direction) | 24 |
| 7 | EMS භාණ්ඩ සඳහා වන තැපැල් ගාස්තු ආපසු ගෙවීම. (Refund) | 25 |
| 8 | භාර ගත් EMS භාණ්ඩ පිටත් කිරීම හා මළු වැසීම | 26 |
| 9 | EMS භාණ්ඩ බෙදීම | 27 |
| 9.1 | බෙදීම් සම්බන්ධ ප්‍රමිතීන් | 27 |
| 9.2 | EMS අයිතම බෙදීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු | 28 |
| 9.3 | පළුදු වී/ අලාභ හානි වී ලැබෙන EMS භාණ්ඩ පිළිබඳ ක්‍රියා කිරීම | 29 |
| 10 | EMS භාණ්ඩ සම්බන්ධයෙන් වන විමසීම් හා පැමිණිලි. | 30 |
| 10.1 | විමසීම් | 30 |
| 10.1.1 | EMS භාණ්ඩයක් පිළිබඳව තොරතුරු දැන ගත හැකි අවස්ථා | 30 |
| 11 | පැමිණිලි | 31 |
| 11.1 | POK60 - විමසීම් පෝරමය පිරවීම | 31-32 |
| 11.2 | තොරතුරු දැන ගැනීම සඳහා විමසීම් | 33 |

# 1. හැඳින්වීම

## 1.1 අත්පොත

තැපැල් දෙපාර්තමේන්තුවේ විදේශ තැපැල් සේවාවන් අතර ඉතා සුවිශේෂී සේවාවක් වන EMS (Express Mail Service) සේවාව වෙනුවෙන් මෙම අත්පොත ප්‍රකාශයට පත් කෙරේ.

සියලු තැපැල් කාර්යාල හා උප තැපැල් කාර්යාලවල නිලධාරීන්ට සිය පාරිභෝගිකයන් වෙනුවන් ගුණාත්මක හා කාර්යක්ෂම සේවාවක් ලබා දීමට මෙන්ම, ජාත්‍යාන්තර කුරියර් සේවාවක් බැවින්, ශ්‍රී ලංකික අපගේ පාරිභෝගිකයන් මෙන්ම විදේශ තැපැල් පරිපාලනයන් ගේ හා ඔවුන්ගේ පාරිභෝගිකයන්ගේ ද අවශ්‍යතාවය මත කාර්යක්ෂම, ගුණාත්මක හා tracking පහසුකම් සහිත විශ්වාසනීය සේවාවක් සැපයීමට මෙම අත්පොතේ ඇති තොරතුරු වැදගත් වනු ඇත.

**අත්පොත පරිශීලනයේ අරමුණු**

- කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් ඉටු කිරීම සඳහා කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම.
- ගුණාත්මක පාරිභෝගික සේවාවක් සැපයීම තුළින් පාරිභෝගික තෘප්තිය වැඩි කිරීම.
- මෙහෙයුම් ක්‍රියාවලිය නිවැරදිව සිදු කිරීම තුළින් සිදු වන නාස්තිය අවම කිරීම හා සේවාව හා බැඳුනු ප්‍රමිතීන් ආරක්ෂා කිරීම.
- කාර්ය සාධනය මත පදනම්ව තැපැල් දෙපාර්තමේන්තුවට ලැබෙන විදේශ තැපැල් ආදායම් ප්‍රශස්ථ වශයෙන් ලබාගැනීම.

**අත්පොත භාවිතය සඳහා උපදෙස්**

ගෝලීය වශයෙන් ඉතා ජනප්‍රිය සේවාවක් වන EMS සේවාව නිරන්තරයෙන් යාවත්කාලීන වෙමින් පවතින බැවින්, වරින්වර ලබා දෙන යාවත්කාලීන වූ තොරතුරු හා සංශෝධන ඇතුළත් කර ගත හැකි වන පරිදි මෙම අත්පොත මාතෘකා වශයෙන් වෙන් කර ලිහිල් බැඳුම් සහිතව ප්‍රයෝජනයට ගත හැකි ලෙස සකස්කර ඇත.

ඒ අනුව, වරින්වර නිකුත් කෙරෙන චක්‍රලේඛ හා උපදෙස් පරිශීලනය කරමින් මෙම අත්පොත යාවත්කාලීනව පවත්වා ගෙන යන මෙන් ඉල්ලා සිටිමි.

## 1.2 EMS සේවාව

EMS සේවාව, කඩිනම් තැපැල් බෙදාහැරීමේ සේවාවක් වෙනුවෙන් විශ්ව තැපැල් සංගමය විසින් හඳුන්වා දුන් ගුවන් තැපැල් සේවාවකි. මෙම සේවාවේ පාලන කටයුතු සඳහා විශ්ව තැපැල් සංගමයට අනුබද්ධ EMS Cooperative ආයතනය පිහිටුවා ඇත.

EMS සේවාව තුළින් භාරගන්නා භාණ්ඩ ඉක්මනින් ගමනාන්ත කරා යැවීමටත්, භාණ්ඩය භාර ගැනීමේ සිට බෙදීම දක්වා ක්‍රියාවලියේ සෑම අවස්ථාවකම පද්ධති ගත කිරීම හරහා පරිභෝගියකයන්ට පවත දැනගැනීමේ (tracking) පහසුකම ලබා දීම මෙම සේවාව ඔස්සේ සිදු වේ.

Express Mail Service (EMS) - ජාත්‍යන්තර කුරියර් සේවාව 1989 දී ශ්‍රී ලංකා තැපෑලට හඳුන්වා දී ඇත. 2025 මැයි මස 29 දින සිට රටවල් 59 ක් වෙත සේවාව ලබා දෙයි.

**EMS භාණ්ඩ භාර ගැනීම හා බෙදා හැරීම:**

දිවයිනේ සියලුම තැපැල් හා උප තැපැල් කාර්යාල හා මධ්‍ය තැපැල් හුවමාරුවේ EMS මධ්‍යස්ථානය මඟින් EMS භාණ්ඩ භාර ගැනීම් පහසුකම් සපයා ඇති අතර, බෙදා හැරීම බෙදීම් පහසුකම් සහිත සියලුම තැපැල් කාර්යාල, බෙදීම් සිදු කරන උප තැපැල් කාර්යාල හා මධ්‍ය තැපැල් හුවමාරුව මගින් සිදු කෙරේ.

EMS මඟින් හුවමාරු වන අයිතම, ලිපි ලේඛන (Documents) හා භාණ්ඩ (Merchandise) වශයෙන් ප්‍රධාන කොටස් දෙකකට බෙදනු ලැබේ.

ලෝකයේ විද්‍යුත් වාණිජ්‍ය (e-commerce) හරහා සිදු වන ගණුදෙනු වැඩිම ප්‍රමාණයක් සිදුවන්නේ ආසියා පැසිපික් කලාපය තුළ වීම නිසා මෙම සේවාව ප්‍රවර්ධනය කර ගුණාත්මක සේවාවක් ලබා දීම තුළින් ආදායම් වර්ධනය කර ගැනීමේ ඉහල ශක්‍යතාවයක් පවතී.

පසුගිය වසර 5ක කාලය තුළ තැපැල් දෙපාර්තමේන්තුවේ EMS භාණ්ඩ යැවීම් හා ලැබීම් තොරතුරු පහත පරිදි වේ.

*1.1 EMS භාණ්ඩ හුවමාරුව - අයිතම සංඛ්‍යාව*

| | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|
| EMS යැවීම් අයිතම වශයෙන් **(Outbound)** | 32,366 | 57,155 | 60,871 | 69,192 | 74,855 |
| | | | | | |
| EMS ලැබීම් අයිතම වශයෙන් **(Inbound)** | 37,484 | 67,092 | 74,070 | 75,492 | 82,141 |

## 2. ප්‍රමිතීන් (Standards)

| | |
|---|---|
| උපරිම බර (Weight) | **සේවාව, ලබා දෙන රට අනුව උපරිම බර වෙනස් වේ**<br><br>**** EMS User Guide හි 2.3 කොටස බලන්න*** |
| පවත ලබාදීම (Tracking) | **අනිවාර්යය වේ.** |
| බාර්කොඩ් භාවිතය | **අනිවාර්යය වේ.** |
| බර්කොඩ් අංකය | **E අක්ෂරයෙන් ආරම්භ වේ.**<br>උදා: **EA 123 456 789 LK** |
| දත්ත පද්ධතියට ඇතුළත් කිරීම<br><br>භාර ගන්නා භාණ්ඩ සඳහා<br><br>බෙදීමට ලැබෙන භාණ්ඩ සඳහා | **අනිවාර්යය වේ.**<br><br>**EMA – Posting/ Collection** අවස්ථාව<br><br>**EMG – Arrival at Delivery Office** අවස්ථාව<br>**EMH – Unsuccessful (physical) delivery** අවස්ථාව<br>**EMI – Final Delivery** අවස්ථාව<br><br>**** Local IPS System User Guide** බලන්න* |
| පාරිභෝගික පැමිණිලි හා පසු විපරම් | **භාරගනු ලැබේ.** |
| වගකීම | • **අවම කාලයකින් ගමනාන්තය වෙත යොමු කරවීම.**<br>• **වන්දි ගෙවීම්/ හානි පූර්ණ උපරිම සීමාවක් දක්වා සිදු කරනු ලැබේ.** |

## 2.1 ක්‍රියාත්මක වන ගමනාන්ත (Destinations)

EMS භාණ්ඩ භාර ගැනීමේ දී, සේවාව ක්‍රියාත්මක වන රටක් බව තහවුරු කර ගැනීමෙන් පසුව භාර ගැනීම අවධානයෙන් යුතුව සිදු කල යුතුය.

EMS සේවාව ක්‍රියාත්මක වන ගමනාන්ත වරින් වර වෙනස් විය හැකි අතර, සේවාව ක්‍රියාත්මක රටවල් මෙන්ම තාවකාලිකව සේවාව අත්හිටුවන රටවල් සම්බන්ධයෙන් සේවා පෝටලයේ හා චක්‍රලේඛ පෝටලයේ දැනුවත් කිරීම් සිදු කරනු ලැබේ.

2025-06-02 දින සිට ක්‍රියාත්මක වන ගමනාන්ත පහත පරිදි වේ.

චක්‍රලේඛය : Updated Air mail List of Countries is opening as of June 02, 2025 until further notice. 2025 අංක POST/HQ/OP/IPS/C/07/2025 (2025-06-02)

EMS Service List

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | Argentina | 21 | India | 41 | Pakistan |
| 2 | Australia | 22 | Indonesia | 42 | Philippines |
| 3 | Austria | 23 | Ireland | 43 | Poland |
| 4 | Bahrain | 24 | Israel | 44 | Portugal |
| 5 | Bangladesh | 25 | Italy | 45 | Qatar |
| 6 | Belgium | 26 | Japan | 46 | Russia |
| 7 | Brazil | 27 | Jordon | 47 | Saudi Arabia |
| 8 | Canada | 28 | Kenya | 48 | Seychelles |
| 9 | China | 29 | Korea South | 49 | Singapore |
| 10 | Cyprus | 30 | Kuwait | 50 | South Africa |
| 11 | Czech Republic | 31 | Latvia | 51 | Spain |
| 12 | Denmark | 32 | Luxembourg | 52 | Sweden |
| 13 | Egypt | 33 | Malaysia | 53 | Switzerland |
| 14 | Finland | 34 | Maldives | 54 | Taiwan |
| 15 | France | 35 | Myanmar | 55 | Thailand |
| 16 | Germany | 36 | Nepal | 56 | Turkey |
| 17 | Great Britain | 37 | Netherland | 57 | UAE |
| 18 | Greece | 38 | New Zealand | 58 | USA |
| 19 | Hong Kong | 39 | Norway | 59 | Vietnam |
| 20 | Hungary | 40 | Oman | | |

## 2.2 තහනම් භාණ්ඩ හා රෙගුලාසි සහිත භාණ්ඩ

### 2.2.1 තහනම් භාණ්ඩ (Prohibited)

රේගු හා නිරෝධායන නීති අනුව රටවල් විසින් තැපැල හරහා තමන්ගේ රටට ඇතුළු කර ගැනීමට තහනම් කල භාණ්ඩ තහනම් භාණ්ඩ ගණයට අයත් වේ. ලෝකයේ එක් එක් රටවල් සඳහා මෙම භාණ්ඩ විවිධාකාර වන අතර මෙලෙස නම් කර ඇති භාණ්ඩ තැපෑලෙන් යැවීමට භාර ගත නොහැක.

විදේශ තැපැල් පරිපාලනයන් මෙම භාණ්ඩ පිළිබඳව විශ්ව තැපැල් සංගමය හරහා අනෙකුත් රටවල් දැනුවත් කෙරේ. විශ්ව තැපැල් සංගමය විසින් මෙසේ වරින් වර යාවත්කාලීන වන භාණ්ඩ ඇතුළත් ලැයිස්තුවක් ප්‍රකාශයට පත් කරන අතර **එම ලැයිස්තුව සේවා පෝටලය හා ශ්‍රී ලංකා තැපැල් වෙබ් අඩවියේ ප්‍රසිද්ධියට පත් කර ඇත. කිසියම් වූ රටක් සඳහා භාණ්ඩ යැවීමට භාර ගැනීමට ප්‍රථමයෙන් මෙම ලැයිස්තුව පරිශීලනය කිරීම වැදගත් වේ.**

ප්‍රකාශයට පත් කර ඇති තහනම් හා රෙගුලාසි සහිත භාණ්ඩ ලැයිස්තුවේ හි රට තේරූ පසු රට අදාළ භාණ්ඩය ඉදිරියෙන් "P" අක්ෂරය දැක්වෙන්නේ එම රටේ තහනම් භාණ්ඩ වේ. “R” අක්ෂරයෙන් දැක්වෙන්නේ රෙගුලාසි සහිත භාණ්ඩ වේ.

**ශ්‍රී ලංකාවේ සිට විදේශයන් සඳහා යැවීමට තහනම් වූ භාණ්ඩ**

- දුම් කොළ, සිගරට් හා දුම්කොළ අනුසාරයෙන් නිෂ්පාදිත ද්‍රව්‍යයන් සහ ඉලෙක්ට්‍රොනික් දුම්වැටි, අබින්, කොකේන්, ගංජා, මෝෆීන් ආදී අන්තරාය කර ඖෂධ පනතට ගැනෙන මත් ද්‍රව්‍ය හා සියළුම මධ්‍යසාර නිෂ්පාදන. (උදා: අරක්කු, බියර්, වයින්, විස්කි)
- ගිනි අවි,අත් බෝම්බ ආදී පුපුරන ද්‍රව්‍ය, අවි ආයුධ සහ ඒවායේ කොටස්.
- වෙඩි බෙහෙත්, රතිඤ්ඤා, මල්වෙඩි, ආදී ගිණි කෙළි භාණ්ඩ.
- කපුරු, කපුරු ආශ්‍රිත නිෂ්පාදන, ලයිටර් ආදී වෙනත් ගිනිගන්නා සුළු ද්‍රව්‍ය ඇතුළත් නිෂ්පාදන
- වායු සම්පීඩන තුවක්කු හා උපාංග, ඩෙටනේටර්, ස්ප්‍රේ ගෑස් (pressurized contains වර්ග), කඳුළු ගෑස්
- ලයිටර් ආදී ඕනෑම ගිනි ගන්නා සුළු ද්‍රව්‍යන් හා තියුණු උපකරණ.
- ගිනි ගන්නා සුළු වාෂ්පශීලි ද්‍රව්‍ය, විකිරණශීලි ද්‍රව්‍ය, න්‍යෂ්ටික ද්‍රව්‍ය හා උපකරණ
- කඳුළු ගෑස්, විකිරණශීලී ද්‍රව්‍ය, වායු ක්‍රියාරම්භකය, වායු තුවක්කු, න්‍යෂ්ටික ද්‍රව්‍ය හා උපකරණ (පිපිරීමට ඉඩ ඇති, අධි පීඩනය යටතේ අසුරා ඇති වර්ග)
- මිනිස් අවයව, පණ ඇති සතුන් හෝ කොටස් (මිනිස් අවයව යන ගණයට නොගැනෙන බැවින් අදාළ ගමනාන්ත රටේ නීති රීති ප්‍රකාරව හිසකෙස් යැවීමට භාර ගත හැක.)
- එළවළු, පළතුරු ආදී කල් තබා ගත නොහැකි නැවුම් ආහාර.
- රාජද්‍රෝහී, අන්තවාදී හෝ ත්‍රස්තවාදී ක්‍රියා හෝ මහජන කැළඹිලි ඇති වේ යැයි සැක සහිත, මහජන ආරක්ෂාවට හා සදාචාරයට හානියක් සිදු වේ යැයි අවධානමක් ඇති වෙනත් තොරතුරු අඩංගු පින්තූර, පොත්,සඟරා වැනි මුද්‍රිත ද්‍රව්‍ය හා සංයුක්ත (CD,VCD,DVD) තැටි හා දත්ත ගබඩා පට ආදී ශ්‍රව්‍ය දෘශ්‍ය ද්‍රව්‍ය. (Storage Devices)
- අසභ්‍ය සහ අශ්ශීල චිත්‍රපට, ප්‍රකාශන සිතුවම් ආදිය හා යම් කිසි ප්‍රකාශනයක් හෝ භාණ්ඩයක් අසභ්‍ය හෝ අශ්ශීල එකක් බවට හඟවන හෝ නිරූපණය කරමින් පල කරන ලද චක්‍රලේඛයක් හෝ දැන්වීමක් හෝ අපහාසාත්මක, තර්ජනාත්මක හෝ අශිෂ්ඨ වචන, සළකුණු හෝ සටහන් කිසිවක් පිට පැත්තේ හෝ කවරය මතුපිට ලියන ලද තැපැල් භාණ්ඩ.

### 2.2.2 රෙගුලාසි සහිත භාණ්ඩ (Restricted)

රටවල් විසින් තැපැල හරහා තමන්ගේ රටට ගෙන්වා ගැනීමට අවසර දී ඇති නමුත්, එසේ ගෙන්වා ගැනීමේ දී රේගු හා නිරෝධායන නීති අනුව විවිධ ලියකියවිලි ඉදිරිපත් කල යුතු භාණ්ඩ මෙම කාණ්ඩයට අයත් වේ. රටින් රටට මෙම භාණ්ඩ වර්ග වෙනස් වන අතර, ඇතැම් භාණ්ඩ වර්ග රට තුළට ඇතුළු කරගැනීම සඳහා බලපත්‍ර, සහතික හෝ නිර්දේශ සමඟ ඉදිරිපත් කරන ලෙස ඇතැම් රටවල් ඉල්ලීම් කර ඇත.

තැපැලෙන් විදේශයන් සඳහා යැවීමට රෙගුලාසි සහිත භාණ්ඩ

- මුදල් නෝට්ටු හෝ කාසි චෙක්පත්, බැංකු අණකර, සුරැකුම්පත් ආදී මූල්‍යමය වටිනාකමකින් යුත් ලියකියවිලි.
- පුරාවිද්‍යාත්මක/සංස්කෘතික වටිනාකමින් යුතු පුරාවස්තු හෝ කලා භාණ්ඩ.
- අවලංගු කල හෝ නොකල තැපැල් මුද්දර.
- රන්, රිදී, ප්ලැටිනම් ආදී වටිනාකමින් වැඩි ද්‍රව්‍ය (විශේෂ අනුමැතියෙන් තොරව යැවිය නොහැක. අදාල ගමනාන්ත රටේ නීතිමය තත්ත්වය මත හා උපරිම වටිනාකම් සීමාවන් අනුව රක්ෂණය තැපැල් සේවය යටතේ පමණක් යැවිය හැක)
- විදේශ ගමන් බලපත්‍ර, බැංකු කාඩ්පත් (එම බලපත්‍ර නිකුත් කරන ලද දෙපාර්තමේන්තුවෙන් /ආයතනයෙන් විධිමත් අවසර පත්‍රයක් සහිතව පමණක් යැවිය හැක.)
- තේ කොළ විදේශ ගමනාන්ත රට සීමාවන් පනවා නොමැති නම්, ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අනුමැතියකින් තොරව තේ 7 kg ක් තැපැල් කළ හැක. (එම බර සීමාව ඉක්මවන්නේ නම් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුතුය.)
- මළ සතුන් සහ කොටස්. (ආහාර සඳහා වියලා සකස් කල කරවල, හාල්මැස්සන්, උම්බලකඩ ආදී වූ ආහාරයක සුවඳ පිට නොවන සේ හොඳින් ආවරණය කර, ගමනාන්ත රටේ තහනම් කර නොමැති නම් පමණක් යැවිය හැක.)
- ඕනෑම ආකාරයක ඖෂධ හා ඖෂධ නිශ්පාදන. (වෛද්‍ය නිර්දේශය සහිතව, ගමනාන්ත රටේ නීති රීති අනුව වලංගුභාවය ඇතොත් පමණක් යැවිය හැක.)
  **ඖෂධ හා ඖෂධ නිශ්පාදන තැපැල් මාර්ගයෙන් යැවීමේ දී, ඒවා පෞද්ගලික පරිභෝජනය සඳහා යවන්නක් විය යුතු වේ. අදාළ ගමනාන්ත රටේ රේගු නීති රීති වලට යටත් වන බැවින් යැවීමට පෙර එම ඖෂධ එම ගමනාන්ත රටට ගෙන්වා ගත හැකි ද යන්න පිළිබඳව ගමනාන්ත රටෙන් පරික්ෂා කර බලා තැපැලට බාරදෙන මෙන් පාරිභෝගිකයා දැනුවත් කිරීම වඩා සුදුසු වේ.**
- වල් කුරුඳු (wild cinnamon)

ඉහත භාණ්ඩ වර්ග වලට අමතරව, එක් එක් රටවල් වල රේගු අධිකාරීන් විසින් සිය රට තුළට ගෙන්වන භාණ්ඩ පිළිබඳව තීරණ ගනු ලබන අතර, ඒ අනුව මෙරටින් යැවීමට තහනම් හෝ රෙගුලාසි නොමැති වුවද, තැපැලෙන් යවන භාණ්ඩ වර්ගය අනුව ඒ සඳහා විවිධ වර්ගයේ සහතික, බලපත්‍ර, ඉන්වොයිස් හා නිර්දේශ වර්ග ඉල්ලීම් කරනු ඇත.

### 2.2.3 සහතික (Certificates), බලපත්‍ර (Licenses), ඉන්වොයිස් (Invoices) හා නිර්දේශ (Recommendations)

**I. ශාක ස්වස්ථතා සහතිකය Phytosanitary Certificate**

බොහෝ රටවල් ශාක හෝ ශාක කොටස් හෝ ශාක නිශ්පාදන වෙනුවෙන් ශාක ස්වස්ථතා සහතිකයක් (ශාක නිරෝධායන සහතිකය) බලාපොරොත්තු වේ.

මෙම සහතිකය ශ්‍රී ලංකාවේ දී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අනුබද්ධිත ජාතික ශාක නිරෝධායන සේවය විසින් ලබා දෙන අතර කටුනායක පිහිටි ශාක නිරෝධායන සේවා ප්‍රධාන මධ්‍යස්ථානය හැරුණු කොට භාණ්ඩ තැපැල් කරන පාරිභෝගිකයන් ගේ පහසුව උදෙසා තැපැල් දෙපාර්තමේන්තුවේ මධ්‍ය තැපැල් හුවමාරුව, මහනුවර ප්‍රධාන තැපැල් කාර්යාලය, ගාල්ල ප්‍රධාන තැපැල් කාර්යාලය, යාපනය ප්‍රධාන තැපැල් කාර්යාලය යන ස්ථාන වල උප මධ්‍යස්ථාන පිහිටුවා ඇත.

මීට අමතරව පහත සඳහන් සහතික ද විවිධ රටවල් විසින් භාණ්ඩ සිය රටට ඇතුළු කිරීමට අවසර ලබා දීම පිණිස පහත සහතික ඉල්ලා තිබිය හැක.

II. **ප්‍රභවස්ථාන සහතිකය Certificate of Origin (COO)** - ලංකා වාණිජ මණ්ඩලය හෝ අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) විසින් නිකුත් කරනු ලැබේ.

III. **Dangerous Goods Declaration (For Hazardous Items**) - අන්තරායදායක භාණ්ඩ සඳහා වන ප්‍රකාශය වන මෙය ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමයේ (IATA) රෙගුලාසි අනුව බලයලත් පුද්ගලයන් විසින් ලබා දෙනු ලැබේ.

IV. **Material Safety Data Sheet (MSDS)/ Safety Data Sheet (SDS) -** මෙම සහතිකය යම් රසායනික ද්‍රව්‍යයක් හෝ අඩංගු යමක් ඇති භාණ්ඩයක් හෝ නිෂ්පාදනයක් පිළිබඳ අත්‍යවශ්‍ය තොරතුරු සපයන සවිස්තරාත්මක ලේඛනයකි. ආරක්ෂාව, නීතිමය අනුකූලතාවය සහ ජාත්‍යන්තර වෙළඳාම් කටයුතු සඳහා මෙම සහතිකය ඉල්ලීම් කරනු ලබන අවස්ථා දැකිය හැක. මෙය Industrial Technology Institute (ITI) කාර්මික තාක්ෂණ ආයතනය මගින් ලබාගත හැක.

V. **Gem and Jewelry Certificate (For Gems & Precious Metals) -** මැණික් හා ස්වර්ණාභරණ සහතිකය/බලපත්‍ර (මැණික් සහ වටිනා ලෝහ සඳහා) මෙය මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් ලබා දෙන සහතිකයකි.

VI. **Commercial Invoice (For Business Shipments) -** වාණිජ ඉන්වොයිසිය: ව්‍යාපාරික භාණ්ඩ සඳහා වාණිජ ඉන්වොයිසියක් ඉදිරිපත් කල යුතු අතර මෙම ඉන්වොයිසිය තුළ අයිතම විස්තරය, වටිනාකම, ප්‍රමාණය සහ HS කේතය සඳහන් විය යුතුය.

VII. **Export License (For Restricted Goods) -** ඇතැම් අයිතම වෙනුවෙන් අපනයනය කිරීමේ අනුමැතියක් ඇති බලපත්‍ර ලබා ගත යුතුව ඇත. මෙම බලපත්‍ර ඒ අදාළ අයිතමය සඳහා වන රජයේ දෙපාර්තමේන්තුව හෝ ආයතනය විසින් නිකුත් කරනු ලැබේ.

උදාහරණ : විදේශ ගමන් බලපත්‍ර - නිකුත් කල දෙපාර්තමේන්තුවෙන් විධිමත් අවසර පත්‍රයක්.
බැංකු කාඩ්පත් වෙනුවෙන් අදාළ බැංකුවෙන් අනුමැතිය දුන් ලිපියක්.
ශ්‍රී ලංකාවේ ජාතික හැඳුනුම්පත හා දේශීය රියදුරු බලපත්‍රය සඳහා විශේෂ අනුමැතියක් අවශ්‍ය නොවේ.

මීට අමතර තොරතුරු පාරිභෝගිකයන් විමසන්නේ නම් ඔවුනට ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ප්‍රකාශයට පත් කර ඇති Export Procedure අත්පොතෙන් හෝ අපනයන සංවර්ධන මණ්ඩලයෙන් තොරතුරු ලබාගත හැකි බවට දන්වා සිටිය හැක.

**නිර්දේශ (Recommendations)**

තැපැල් මඟින් යැවීමට භාරගන්නා ඇතැම් භාණ්ඩ සඳහා විශේෂ නිර්දේශ ඇතුළත් කල යුතු අවස්ථා ඇත.

උදාහරණ ලෙස :

ඖෂධ වර්ග තැපෑලෙන් යැවීමේ දී එම බෙහෙත් වර්ග පැහැදිළිව සටහන් වී ඇති වෛද්‍ය නිර්දේශය (prescription) CN23 පත්‍රිකාව සමඟ නොගැලවෙන සේ භාණ්ඩය මත ඇලවීම කල යුතුය. මෙහි දී එම වෛද්‍ය නිර්දේශයේ පිටපතක් භාණ්ඩය තුළට ඇතුළත් කිරීම වඩා සුදුසු වේ.

### 2.2.4 ගුවන් මගින් ගෙන යාම සඳහා ශ්‍රී ලංකා තැපැල විසින් භාර නොගන්නා භාණ්ඩ / අන්තරායදායක භාණ්ඩ (Dangerous Goods)

ශ්‍රී ලංකාවේ, ගුවන් මගින් අන්තරායදායක භාණ්ඩ ප්‍රවාහනය නියාමනය කරනු ලබන්නේ සිවිල් ගුවන් සේවා අධිකාරිය (CAASL) විසින් වන අතර, එය ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ (ICAO) තාක්ෂණික උපදෙස් වලට අනුකූල වේ. **ගුවනින් ගෙන යාමේ දී සෞඛ්‍යයට, ආරක්ෂාවට, දේපළට හෝ පරිසරයට අවදානම් ඇති කරන ද්‍රව්‍ය (ඝන,ද්‍රව,වායු) මෙම කාණ්ඩයට අයත් වේ. සිවිල් ගුවන් සේවා අධිකාරිය හා ගුවන් සමාගම් විසින් ගුවන් තැපැල ලෙස භාර නොගන්නා භාණ්ඩ පහත පරිදි වේ.**

- ලිතියම් බැටරි අඩංගු උපකරණ
- ද්‍රව වර්ග
- ඔක්සිකාරක ද්‍රව්‍ය
- හානිකර රසායනික ද්‍රව්‍ය ඇතුළත් භාණ්ඩ
- රුධිර සාම්පල, සජීවී ක්ෂුද්‍ර ජීවින්, රසායනාගාර සහ වෛද්‍ය කටයුතු සඳහා පමණක් (සෞඛ්‍ය අමාත්‍යංශයේ, වෛද්‍ය පර්යේෂණායතනයේ අවසරය මත)

මෙවැනි භාණ්ඩ තැපැල් මගින් ගුවනින් යැවීමට නම්, සහතිකලත් නිලධාරියෙකුගේ විශේෂ අනුමැතියක් අවශ්‍ය වේ.

මෙම විශේෂ සහතිකය ලබා ගැනීමට තැපැල් දෙපාර්තමේන්තුව මේ වන විටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ලබා ගනිමින් පවතින අතර, මෙවැනි භාණ්ඩ විශේෂ අසුරුම්කරණයකට ලක් කර විශේෂ සැලකීමකින් භාර ගත යුතු බැවින්, භාණ්ඩ භාර ගැනීම හා එය කල යුතු ආකාරය පිළිබඳව ඉදිරියේ දී තැපැල් කාර්යාල දැනුවත් කිරීමට බලාපොරොත්තු වේ.

## 2.3 ප්‍රමාණය හා බර


ජාත්‍යන්තර තැපැල් ප්‍රවාහන නීති හා එක් එක් රටවල් වල ප්‍රවාහන නීති අනුව EMS භාණ්ඩ වල උපරිම දිග, උපරිම විශාලත්වය හා උපරිම බර ප්‍රමාණ විශ්ව තැපැල් සංගමය විසින් දන්වා ඇත. මෙම සීමාවන් ඉක්මවා භාර ගත් භාණ්ඩ විදෙස් තැපැල් පරිපාලනයන් හා ගුවන් සමාගම් විසින් භාර ගැනීම ප්‍රතික්ෂේප කර බොහෝවිට හරවා එවනු ලබන ඒ සෑමවිටම, භාණ්ඩය එරට බෙදීම් සඳහා වන ගාස්තු හා/ හෝ නැවත එවීම වෙනුවෙන් ගාස්තු අය කරනු ලබයි.


**පාර්සලයක උපරිම විශාලත්වය ගණනය කිරීම පහත පරිදි සිදු කල හැක.**

විශාලත්වය = උස සහ පළලෙහි එකතුව 2න් ගුණ කර එයට දිග එකතු කිරීම. **එනම්,**

විශාලත්වය = [පාර්සලයේ පළල පැත්තේ වට ප්‍රමාණය (Girth)
+ දිග (Length)]

විශාලත්වය = සිලින්ඩාකාර භාණ්ඩයක නම්, වෘත්තාකාර සමතල පෘෂ්ඨයේ වගේ දිග (පරිධිය) + දිග




2026-03-10 දිනට EMS හි දක්වා ඇති EMS සේවාවට අදාළව සම්මත බර හා ප්‍රමාණ සීමා පහතින් දැක්වේ.
(මෙම බර හා ප්‍රමාණ සීමා වෙනස් විය හැකි අතර එවන් අවස්ථාවලදී චක්‍රලේඛ හෝ සේවා පුවත් මගින් දැනුම් දෙනු ඇත.)

| අංකය | ගමනාන්තය | පාර්සලයේ විශාල පැත්තේ උපරිම දිග (cm) | පාර්සලයේ උපරිම විශාලත්වය (cm) | පාර්සලයේ උපරිම බර (kg) |
|---|---|---|---|---|
| 1 | Argentina (AR) | 105 cm | 200 cm | 20 kg |
| 2 | Australia (AU) | 100 cm | 200 cm | 20 kg |
| 3 | Austria (AT) | 150 cm | 300 cm | 30 kg |
| 4 | Bahrain (BH) | 150 cm | 300 cm | 30 kg |
| 5 | Bangladesh (BD) | 150 cm | 300 cm | 20 kg |
| 6 | Belgium (BE) | 150 cm | 300 cm | 30 kg |
| 7 | Brazil (BR) | 100 cm | 200 cm | 30 kg |
| 8 | Canada (CA) | 150 cm | 300 cm | 30 kg |
| 9 | China (CN) | 150 cm | 300 cm | 30 kg |
| 10 | Cyprus (CY) | 150 cm | 300 cm | 30 kg |
| 11 | Czech Rep. (CZ) | 150 cm | 300 cm | 30 kg |
| 12 | Denmark (DK) | 100 cm | 200 cm | 20 kg |

| | | | | |
|---|---|---|---|---|
| 13 | Egypt (EG) | 150 cm | 300 cm | 30 kg |
| 14 | Finland (FI) | 100 cm | 200 cm | 30 kg |
| 15 | France (FR) | 150 cm | 300 cm | 30 kg |
| 16 | Germany (DE) | 100 cm | 200 cm | 30 kg |
| 17 | Great Brittan (GB) | 150 cm | 300 cm | 30 kg |
| 18 | Greece (GR) | 150 cm | 300 cm | 30 kg |
| 19 | Hong Kong (HK) | 150 cm | 300 cm | 30 kg |
| 20 | Hungary (HU) | 150 cm | 300 cm | 30 kg |
| 21 | India (IN) | 100 cm | 200 cm | 30 kg |
| 22 | Indonesia (ID) | 150 cm | 300 cm | 30kg |
| 23 | Ireland (IE) | 150 cm | 300 cm | 30 kg |
| 24 | Israel (IL) | 150 cm | 300 cm | 30 kg |
| 25 | Italy (IT) | 150 cm | 300 cm | 30 kg |
| 26 | Japan (JP) | 150 cm | 300 cm | 30 kg |
| 27 | Jordan (JO) | 100 cm | 200 cm | 30 kg |
| 28 | Kenya (KE) | 150 cm | 300 cm | 30 kg |
| 29 | Korea South (KR) | 100 cm | 200 cm | 30 kg |
| 30 | Kuwait (KW) | 150 cm | 300 cm | 30 kg |
| 31 | Latvia (LV) | 150 cm | 300 cm | 30 kg |
| 32 | Luxembourg (LU) | 150 cm | 300 cm | 30 kg |
| 33 | Malaysia (MY) | 150 cm | 300 cm | 30 kg |
| 34 | Maldives (MV) | 150 cm | 300 cm | 30 kg |
| 35 | Myanmar (MM) | 150 cm | 300 cm | 30 kg |
| 36 | Nepal (NP) | 100 cm | 200 cm | 30 kg |
| 37 | Netherlands (NL) | 150 cm | 300 cm | 23 kg |
| 38 | New Zealand (NZ) | 150 cm | 300 cm | 30 kg |
| 39 | Norway (NO) | 150 cm | 300 cm | 30 kg |
| 40 | Oman (OM) | 150 cm | 300 cm | 30 kg |
| 41 | Pakistan (PK) | 150 cm | 300 cm | 30 kg |
| 42 | Philippines (PH) | 150 cm | 300 cm | 20 kg |
| 43 | Poland (PL) | 150 cm | 300 cm | 20 kg |
| 44 | Portugal (PT) | 150 cm | 300 cm | 30 kg |
| 45 | Qatar (QA) | 150 cm | 300 cm | 30 kg |
| 46 | Russia (RU) | 100 cm | 200 cm | 30 kg |
| 47 | Saudi Arabia (SA) | 150 cm | 300 cm | 30 kg |
| 48 | Seychelles (SC) | 100 cm | 200 cm | 30 kg |
| 49 | Singapore (SG) | 150 cm | 300 cm | 30 kg |
| 50 | South Africa (ZA) | 150 cm | 200 cm | 30 kg |
| 51 | Spain (ES) | 100 cm | 200 cm | 30 kg |
| 52 | Sweden (SE) | 100 cm | 200 cm | 20 kg |
| 53 | Switzerland (CH) | 150 cm | 300 cm | 30 kg |
| 54 | Taiwan (TW) | 100 cm | 200 cm | 20 kg |

| | | | | |
|---|---|---|---|---|
| 55 | Thailand (TH) | 100 cm | 200 cm | 30 kg |
| 56 | Turkiye (TR) | 150 cm | 300 cm | 30 kg |
| 57 | UAE (AE) | 100 cm | 200 cm | 30 kg |
| 58 | USA (US) | 100 cm | 200 cm | 30 kg |
| 59 | Vietnam (VN) | 150 cm | 300 cm | 30 kg |

*Source: EMS Operational Guide 2026-3-10*

**2.3.1 ප්‍රමාණය, බර හා ඇසුරුම සඳහා වන විශේෂ උපදෙස්**

- EMS මගින් යැවෙන ලිපි ලේඛන ඇසුරුම් කිරීමේ දී අවම වශයෙන් A4 ප්‍රමාණය බහාලිය හැකි C4 ප්‍රමාණයේ (සෙන්ටි මීටර් 32.4 x 22.9) ශක්තිමත් ලියුම් කවරයක් (100gsm හෝ ඊට වැඩි) හෝ පෙට්ටියක් භාවිතා කල යුතු වේ.
- භාණ්ඩ ඇසුරුම් කිරීමේ දී ඇතුළත ඇති ද්‍රව්‍යන්ගේ බර, හැඩය සහ ස්වභාවයට සරිලන පරිදි ඇසුරුම් කළ යුතු අතර, ශක්තිමත් Carton Box භාවිතා කළ යුතු වේ. (ඇසුරුමේ හා අන්තර්ගත භාණ්ඩ අතර හිස් අවකාශ නොමැතිව)
- ඇතුළත අඩංගු වන භාණ්ඩ අතර, කුළු බඩු, ශාකමය කොටස් අඩංගු ද්‍රව්‍ය, සකස් කළ ආහාර ද්‍රව්‍ය වැනි දෑ ඇත්නම් ගන්ධය වහනය නොවන පරිදි හා කාන්දු වීම් (Leakage) සිදු නොවන පරිදි ඇසුරුම් කළ යුතුය. එවැනි ද්‍රව්‍ය වායුරෝධක පැකට් ලෙස (Vacuum Pack) ලෙස ඇසිරීම වඩාත් සුදුසු බව පාරිභෝගිකයන් දැනුවත් කල යුතුය. **(යවන භාණ්ඩ වල කාන්දු වීම සිදුවුවහොත් ඒ සමඟ යවන අනෙකුත් භාණ්ඩවල තැවරීමෙන් එම භාණ්ඩවලට හානි වීමට ඉඩ ඇති අතර අනවශ්‍ය ප්‍රමාදවීම් ද සිදුවිය හැක.)**
- මෙසේ ඇතුළත් කරන කුළු බඩු හා සකස් කළ ආහාර වැනි ද්‍රව්‍ය පැකට්ටු වල, බර, නිෂ්පාදිත දිනය,කල් ඉකුත් වන දිනය, සැකසූ ආහාරයක් නම් ඇතුළත් වී ඇති ද්‍රව්‍ය හා නිෂ්පාදිත රට ඉංග්‍රීසි භාෂාවෙන් ලේබලයක් ලෙස සඳහන් කළ යුතු වේ. මෙම ඇසුරුම් කාර්ය ජාත්‍යන්තර ප්‍රමිතීන් ලබාගත් ආයතනයකින් කරන්නේ නම් වඩාත් සුදුසු වේ.
- තැපැල් කාර්යාල කවුළුවේ දී පරීක්ෂාවෙන් පසු ඇසුරුමේ පියන් නොගැලවෙන සේ ගම් ටේප් /සෙලෝ ටේප් මඟින් ඇලවිය යුතු වේ. එමෙන්ම භාණ්ඩයේ දාර පළුදු වීමෙන් වැළකෙන සේ හොඳින් සෙලෝ ටේප් ඇලවීමට උපදෙස් ලබා දිය යුතුය.
- EMS තැපැල් භාණ්ඩ වල ලිපිනය නිවැරදිව පැහැදිලි ඉංග්‍රීසි කැපිටල් අකුරින් ලිවීම හෝ පාර්සලයේ ප්‍රමාණයට ගැලපෙන පරිදි මුද්‍රණය කර ඇලවිය යුතු වේ. ලිපිනයන් හි වැඩි ආරක්ෂාවට ලිපින මත සෙලෝ ටේප් ඇලවීමට උපදෙස් ලබා දිය හැක.
- ලිපිනයන්, බාර් කෝඩ් අංකය සහ තැපැල් නිලධාරීන් විසින් යොදන සටහනක් හැරුණු කොට වෙනත් යමක් භාණ්ඩයේ මුහුණතේ නොලිය යුතු බවට පාරිභෝගිකයා වෙත උපදෙස් ලබා දිය යුතුය.
- ලිපිනයන් ඇලවීමේ දී හෝ ලිවීමේ දී බාර්කෝඩ් ලේබලය ඇලවීමට ඉඩ තබා ලිපින ලිවීම හෝ ඇලවීම කල යුතු බවට උපදෙස් ලබා දිය යුතුය.
- සම්පූර්ණ කරන ලද හෝ මුද්‍රණය කරන ලද CN23 පත්‍රිකාව භාණ්ඩයේ ඉදිරිපස,පිටුපස හෝ පැත්තක පැහැදිළිව නිරීක්ෂණය කල හැකි ආකාරයට නොගැලවෙන සේ ඇලවිය යුතුය.

## 2.4 ලිපින ලිවීම.

### 2.4.1 පොදු කරුණු




- ඉංග්‍රීසි භාෂාවෙන් (Capital) පැහැදිලි අත් අකුරින් හෝ මුද්‍රිත අකුරු වලින් තිබිය යුතුය.
- කවුළුවට ඉදිරිපත් කරන භාණ්ඩයක ලිපිනය වෙනත් භාෂාවකින් ලියා ඇති විටක දී, එය පැහැදිලි ඉංග්‍රීසි අකුරින් ලියන ලෙස එය ඉදිරිපත් කරන්නාට දැන්විය යුතුය.
- භාණ්ඩයේ ලියා ඇති ලිපිනයන් හා පුරවාදෙන CN23 පෝරමයේ ඇති ලිපිනයන් සමාන හා නිවැරදිව සටහන් විය යුතුය.
- භාණ්ඩයේ මුහුණතේ වම් පස යවන්නාගේ ලිපිනය "FROM" යටතේ ද, දකුණු පස ලබන්නාගේ නම හා ලිපිනය "TO " යටතේ ද සඳහන් විය යුතුය.
- යවන්නා ගේ ලිපිනය හා ලබන්නා (ලිපිහිමි) ගේ ලිපිනය යන දෙකම ලිවීම අනිවාර්ය වේ.
- ශ්‍රී ලංකාව තුළ තැපැල් ලිපිනයක් නොමැතිව භාණ්ඩ යැවීම සඳහා පැමිණෙන විදේශික සංචාරකයෙකු, යවන්නාගේ ලිපිනය ලෙස භාර දෙන තැපැල් කාර්යාලයේ ලිපිනය යොදාගැනීමට කරන ඉල්ලීමක දී ඒ සඳහා තැපැල්/උප ස්ථානාධිපතිගේ අභිමතය මත අවසර ලබා දිය හැක.නමුත් අනාගත අවශ්‍යතාවයක දී අදාළ විදේශිකයා සම්බන්ධ කරගත හැකි වන පරිදි තොරතුරු තැපැල්/උප ස්ථානාධිපති සතු විය යුතුය. (යවන්නාගේ නම අනිවාර්යයෙන් භාණ්ඩයේ හා CN23 පත්‍රිකා වල සටහන් විය යුතුය.)

### 2.4.2 ලබන්නා (ලිපිහිමි) ගේ ලිපිනය:

- ලබන්නාගේ ලිපිනය නිවැරදිව හා සම්පූර්ණයෙන් ලියා ඇත්දැයි විශේෂ අවධානය යොමු කළ යුතුය.
- ලබන්නාගේ දුරකථන අංකය අනිවාර්යෙන් භාණ්ඩයේ හා CN23 පත්‍රිකාවේ සටහන් කරවාගත යුතු අතර, email ලිපිනයක් ඇත්නම් එය සටහන් කරවාගත යුතුයි. (ඇතැම් ගමනාන්ත විසින් SMS පණිවුඩ මඟින් හෝ email පණිවුඩ මඟින් ලබන්නා දැනුවත් කිරීම් සිදු කරනු ලැබේ).
- ලබන්නාගේ ගමනාන්ත රට කුමක්ද යන්න නිවැරදිව හඳුනා ගත යුතු අතර ලිපිනයේ අවසානයේ සඳහන් විය යුත්තේ ගමනාන්ත රට වේ.

නිවැරදි විදේශ ලිපිනයක් සඳහා උදාහරණ :

| **Address Component** | **Example** |
|---|---|
| Receivers Name | Mr. David Perera |
| Home & Street Address | 123, Forth Street, |
| City/Town | Ottawa (ON) |
| Province | Ontario |
| Postal Code/ Zip Code | K2K 1X8 |
| Country | CANADA |

### 2.4.3 Post Code/ ZIP Code

තැපැල් බෙදීම හා වර්ග කිරීම කාර්යක්ෂම කිරීම සඳහා බොහෝ රටවල් Postal code නැතහොත් ZIP code ලිපිනයේ කොටසක් ලෙසට භාවිතා කෙරේ. ZIP code යන යෙදුම ප්‍රධාන වශයෙන් ඇමරිකා එක්සත් ජනපදයේ භාවිතා වන අතර අනෙකුත් බොහෝ රටවල් යොදා ගන්නේ post code යන සාමාන්‍ය යෙදුමයි. මෙම කේතයන් අංක ලෙස ද, අකුරු හා අංක වල එකතුවක් ලෙසද තිබිය හැක.

උදාහරණ ලෙස:

- Canada: Postal Code (e.g., K1A 0B1)
- UK: Postcode (e.g., SW1A 1AA)
- Germany: Postleitzahl or PLZ (e.g., 10115)
- Australia: Postcode (e.g., 2000)

### 2.4.4 ලිපිනයන් ලිවීමේ දී සිදුවන වැරදි

**ගමනාන්ත රටේ නම සඳහන් කිරීමෙන් අනතුරුව ඊට ආසන්න ප්‍රසිද්ධ රටක නමක් සඳහන් කර තිබීම.**

| | | |
|---|---|---|
| To:<br>Director – Commercial<br>BEGCO S.A. de C.V.<br>Av. Americas,<br>HSBS CP 44630 Guadalajara,<br>Jlisco,<br>Mexico,<br>USA. | To:<br>V.Vathana<br>OPK 003,<br>Nauru Regional Processing Centre,<br>P.O.B 20,<br>Republic of Nauru,<br>Australia. | To:<br>A.B. C Company,<br>No.41<br>Hat 17,<br>Kazakhstan<br>090000 Ind,<br>Russia |

- ඉහත උදාහරණයන්හි ගමනාන්ත රට වැරදි ලෙස සටහන් කර ඇති අතරම (ගමනාන්ත 2ක් සටහන් වී ඇත.) නිවැරදි ගමනාන්ත රටට අප රට විසින් EMS සේවාව ලබා නොදේ.
- ගමනාන්ත රට නිවැරදි නොවුන හොත්, සඳහන් රටෙන් අදාළ ගමනාන්ත රටට හරවා යැවීමක් හෝ නැවත ආපසු එවීමක් සිදුවන අතර ඒ සඳහා අමතර ගාස්තු/වරදවා යැවීමේ ගාස්තු (missent charges) විදේශ පරිපාලනයන් විසින් අය කර ගනු ලැබේ.
- ලිපිනය නිවැරදි වීම පිළිබඳව කවුළු නිලධාරියා හා අධීක්ෂණ නිලධාරියා විශේෂ අවධානය යොමු කළ යුතුය.

**ගමනාන්තය වෙනත් රටක් ලෙස සැළකීම.**

ලිපිනයන් ලිවීමේ දී පෙර වර්ෂවල යටත් විජිත වශයෙන් පැවති, දැනට ස්වාධීනත්වය ලබා ඇති රටවල නම් සඳහන් කිරීමේ දී පහත පරිදි වැරදීම් සිදු වී ඇති බව වාර්තා වී ඇත.

- Faroe Island, Denmark යනුවෙන් සඳහන් කර ඇති ලිපිනයක ගමනාන්තය Faroe Island ලෙස සැලකිය යුතුය. Faroe Island සහ Denmark යනු රටවල් දෙකකි.
- Northern Ireland, United Kingdom හෝ Northern Ireland, Great Britain යනුවෙන් සඳහන් කර ඇත්නම් ගමනාන්තය Northern Ireland ලෙස සැලකිය යුතුය.
- Hong Kong, China යනුවෙන් සඳහන් කර ඇති ලිපිනයක ගමනාන්තය Hong Kong ලෙස සැලකිය යුතුය.

- Macau,China යනුවෙන් සඳහන් කර ඇති ලිපිනයක ගමනාන්තය Macau ලෙස සැලකිය යුතුය.
- People's Republic of China යනුවෙන් සඳහන් කර ඇත්නම් ගමනාන්තය China ලෙස සැලකිය යුතුයි.
- Republic of China යනුවෙන් සඳහන් කර ඇත්නම් ගමනාන්තය Taiwan ලෙස සැලකිය යුතුයි.

**එක සමාන නම් හා අක්ෂර සහිත වීම නිසා සිදු වන වැරදීම්**

බොහෝ අවස්ථාවල එක සමාන අක්ෂර හෝ බැලූ බැල්මට එකවර,පැහැදිලිව වෙන්කර හඳුනා ගත නොහැකි වීම නිසා ලිපින ලිවීමේ දී වැරදීම් සිදු වී ඇති බව වාර්තා වී ඇති අතර, එබැවින් පහත සඳහන් රටවල් වෙත තැපැල් භාණ්ඩ භාර ගැනීමේ දී වැඩි සැලකිල්ලකින් ක්‍රියා කල යුතු අතර නිවැරදි රට හඳුනා ගෙන නිවැරදි ගාස්තු අය කිරීම් සිදු කල යුතුය.

| | | | |
|---|---|---|---|
| **1** | **Australia** *and* **Austria** | **11** | **Mali (a country)** *and* **Malé(capital of Maldives)** |
| **2** | **Dominica** *and* **the Dominican Republic** | **12** | **Mauritania** *and* **Mauritius** |
| **3** | **Gambia** *and* **Zambia** | **13** | **Monaco** *and* **Morocco** |
| **4** | **Guyana** *and* **Ghana** | **14** | **Niger** *and* **Nigeria** |
| **5** | **Iran** *and* **Iraq** | **15** | **Samoa** *and* **American Samoa** |
| **6** | **Ireland** *and* **Iceland** | **16** | **Slovakia** *and* **Slovenia** |
| **7** | **KSA** *and* **USA** | **17** | **Sweden** *and* **Switzerland** |
| **8** | **Liberia** *and* **Lybia** | **18** | **Switzerland** *and* **Swaziland** |
| **9** | **Lithuania** *and* **Latvia** | **19** | **Togo** *and* **Tonga** |
| **10** | **Malawi** *and* **Maldives** | **20** | **Uruguay** *and* **Paraguay** |

**Guinea /French Guyina/Guinea-Bissau/Equatorial Guinea** යනුවෙන් සඳහන් කර ඇත්නම් එකම රටක් නොවන අතර වෙන් වෙන් රටවල් වශයෙන් සලකා නිවැරදි ගාස්තු අය කළ යුතුයි.

**ගමනාන්තය ලෙස නගරයක නමක් සඳහන් කර තිබීම.**

යවන්නා ලිපිනය ලිවීමේ දී ගමනාන්ත රටේ නම සඳහන් නොකර නගරයක නමක් පමණක් සඳහන් කර ලිපිනය ලියා ඇත්නම් ගමනාන්ත රට කුමක්ද යන්න යවන්නා ලවා සඳහන් කරවා ගත යුතුය. ඇතැම් ප්‍රධාන නගරවල නම් රටවල් කිහිපයක තිබිය හැකි බැවින් මේ පිළිබඳ කවුළු නිළධාරීන්ගේ විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

උදාහරණ ලෙස:

1. *Victoria*, Australia / *Victoria* , Seychelles
2. *Hyderabad*, India / *Hyderabad*, Pakistan
3. *Auckland*, New Zealand/ *Auckland*, California, USA
4. *Moscow*, Russia/ *Moscow*, Kansas, USA
5. *Sydney*, Australia/ *Sydney*, Canada
6. *Paris*, France/ *Paris*, Texas, USA

## 3. තැපැල් ගාස්තු ගණනය කිරීම. (Postage)

- යවන රට හා බර ප්‍රමාණය අනුව තැපැල් ගාස්තුව නිවැරදිව ගණනය කර මුදලින් අය කර ගත යුතු වේ. අය කර ගත් මුදල් එදිනම මුදල් ගිණුම මගින් ප්‍රේෂණය කල යුතුය.

- CN23 Customer Copy - යනු මුදල් භාර ගැනීම වෙනුවෙන් පාරිභෝගිකයාට ලබා දෙන කුවිතාන්සිය වේ.

- විමසීම්, පැමිණිලි, තැපැල් ගාස්තු ආපසු ගෙවීම් හා වන්දි ලබා ගැනීම් සඳහා කරන ඉල්ලීම් වල දී මෙම කුවිතාන්සියේ මුල් පිටපත ඉදිරිපත් කල යුතු වේ.

- ගාස්තු සඳහා විදේශ තැපැල් ගාස්තු සංශෝධනය 2022 තැපැල්පති චක්‍රලේඛ අංක 11/2022 පිටු අංක 4 සිට 17 අදාළ වේ.

# 4. භාණ්ඩ භාර ගැනීම.


### 4.1 CN23 පෝරම හා EMS barcode ලේබල් කළමනාකරණය


EMS සේවාව වෙනුවෙන් CN23 පිටපත් 5කින් යුතු කාබනිකෘත (Carbonized) පෝරමයක් සහා E අක්ෂරයෙන් පටන් ගන්නා අංක 9කින් යුතු සම්මත barcode ලේබල නිකුත් කර ඇත. තැපැල් / උප තැපැල් කාර්යාලයට අවශ්‍ය වන පරිදි පමණක් පෝරම හා barcode ලේබල ගෙන්වා තබාගත යුතුය. අනවශ්‍ය තොග තබා ගැනීමෙන් කල් ඉකුත් වී පෝරම වල හා barcode ලේබල වල ගුණාත්මකභාවය අඩු විය හැක.

### 4.2 CN23 පෝරමය පිරවීම.

CN23 පිටු 5කින් යුතු පෝරමය Local IPS system හි භාණ්ඩ භාර ගැනීම් දත්ත ඇතුළත් කිරීමෙන් පසු මුද්‍රණය කර ගැනීමට හැකි වන පරිදි සකස්කරන ලද්දකි. නමුත් මුද්‍රණය වූ පසු පෝරමයේ ඇති යවන්නා විසින් සලකුණු කල යුතු කුඩා කොටු වලට අදාළ තොරතුරු පාරිභෝගිකයා ලවා පුරවා දිනය හා අත්සන යොදා ගෙන භාරගත යුතුය.

මුද්‍රිත පිටපත් ලබාගත නොහැකි අවස්ථාවක දී එය යවන්නා විසින් සම්පූර්ණයෙන් පිරවිය යුතු අතර CN23හි ඇතුළත් විය යුතු කරුණු පහත පරිදි විය යුතුය.






**Detailed Description:** මෙම කොටසේ දී භාණ්ඩ වර්ගය කුමක්ද යන්න පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු (ඉංග්‍රීසි භාෂාවෙන්) නිවැරදිව සටහන් කල යුතුය.

- ලිපි ද්‍රව්‍යක් නම් : birthday card, official letter, ect.
- ආහාර වර්ගයක් නම් : බැදපු බටු මොජු/අච්චාරු: Fried brinjal/Eggplant Pickle, වියලි හාල්මැස්සන් - Dried Sprat fish / කරවල - Dried Fish, මාළු ඇඹුල්තියල් - Pre cooked fish, බයිට්/මුරුක්කු වැනි ආහාර - snacks, අල පෙති - potato chips
- විශේෂ ක්‍රමවේදයකට සැකසූ අහාර සඳහා සකස් කර ඇති අකාරය අනුව processed/ dehydrated/ preserved වැනි වචනයක් භාවිතා කල හැක.
- සමහන් : Samahan (herbal tea) / සිද්ධාලේප බාම් : ayurvedic balm
- ඇඳුම් වර්ගයක් නම්: men's shirt, kids tshirt, men's saron, batik sari ලෙස විස්තරාත්මකව සටහන් කල යුතුය.

**Net Weight: එක් එක් අයිතමයේ බර කිලෝ ග්‍රෑම් වලින්** සටහන් කල යුතුය.
උදාහරණ ලෙස: **400g = 0.4kg, 40g = 0.04kg, 1kg 400g = 1.4kg**


**HS tariff number: HS තීරුබදු අංකය යනු (HS code හෝ Harmonized System code ලෙස ද හැඳින්වේ) වෙළඳ කටයුතු සඳහා වන භාණ්ඩ වර්ග (trade goods) වර්ගීකරණය කර ඇති ජාත්‍යන්තර ප්‍රමිතිගත කේතයකි. රේගු කටයුතු සඳහා භාවිතා කරනු ලැබේ.**
තැපැල් දෙපාර්තමේන්තුවේ දැනට භාවිතා කෙරෙනුයේ අංක 06ක් සහිත HS කේත වේ. සමහර ගමනාන්ත රටවල් අංක 8, 10, 12 HS කේත භාවිතා කරන අවස්ථා දැකිය හැක. මෙවන් විශේෂ අවස්ථා වල දී යවන්නා විසින් යවන භාණ්ඩ වලට අදාළ HS කේත ලබන්නාගෙන් හෝ ගමනාන්ත රටේ රේගුවෙන් විමසා සටහන් කල යුතු වේ.

උදාහරණ : අයර්ලන්තය

**EMS භාණ්ඩ සඳහා International Priority ලකුණු කරන්න.**

**මුළු බර (කිලෝ ග්‍රෑම්) වලින් සඳහන් කරන්න.**
**Eg: 400g – 0.4kg**
**40g – 0.04kg**
**1kg 400g – 1.4kg**

**මුළු වටිනාකම (රුපියල්) වලින් සඳහන් කරන්න.**





**පාර්සල් වර්ගය (තෑගි භාණ්ඩ, වාණිජ භාණ්ඩ, ලියකියවිලි, Returned, Others..) සඳහන් කරන්න.**

**භාණ්ඩය සම්බන්ධයෙන් විශේෂ දැනුවත් කිරීමක් අවශ්‍ය නම් උදා: භාණ්ඩය පිටත් කිරීමට පෙර නිරෝධායනය කල යුතු නම් මෙහි සඳහන් කරන්න.**

Category of Item: මෙහි දී යවන භාණ්ඩයේ වර්ගය තේරීම කල යුතුය.

- Gift - තෑග්ගක් ලෙස යවන භාණ්ඩයක් නම්,
- Document - ලියකියවිලි පමණක් ඇතුළත් භාණ්ඩයක් නම්,
- Commercial sample - වාණිජ්‍ය සාම්පලයක් නම්,
- Returned goods - ආපසු යවන භාණ්ඩයක් නම්,
- Sales of goods - විකිණීමක් සඳහා යවන භාණ්ඩයක් නම්,
- Others - ඉහත වර්ගවලට ඇතුළත් නොවෙන භාණ්ඩයක් නම්,




තැපැල් ගාස්තුව (රුපියල්) වලින් සඳහන් කරන්න


භාරගත්බවට නිලධාරියාගේ අත්සන හා අධීක්ෂණ නිලධාරියාගේ අත්සන හා කාර්යාලයේ දින මුද්‍රාව

පාර්සල් ගණන හා අමුණා ඇති ලියකියවිලි ගණන

රක්ෂණය කර ඇත්නම් එම වටිනාකම (SDR වලින්)

මුළු ගාස්තුව

මුළු බර (කිලෝ ග්‍රෑම්) වලින්


Sender's instructions in case of non-delivery
(9)
Return immediately to sender
Return to sender after ......... Days
Treat as Abandoned
Redirect to address below
Return/ Redirect
by surface/ S.A.L
by air
Address

CN23 පෝරමය පිරවීමේ දී මෙම කොටස ඉතා වැදගත් හා අනිවාර්ය වන අතර, භාණ්ඩය නොබෙදුණු අවස්ථාවක දී භාණ්ඩය පිළිබඳව ක්‍රියා කළ යුතු ආකාරය පාරිභෝගිකයා විසින් පිරවිය යුතුය.

මෙහිදී භාණ්ඩය ආපසු එවිය යුතු ආකාරය තෝරා ගැනීමට යවන්නා වෙත විකල්ප කිහිපයක් ලබා දී ඇත.

- **Return to sender after ......... days:** විශේෂිත දින ගණනක් රඳවා තබා භාණ්ඩය නැවත ගෙන්වා ගැනීමට නම්, එම දින ගණන හිස්තැනෙහි සට හන් කල යුතුය.
- **Return immediately:** වහාම ආපසු ගෙන්වා ගැනීමට නම්,
- **Treat as Abandoned:** අත්හැර දැමූ භාණ්ඩයක් සේ සැලකිය යුතු නම්,
- **Redirect to address:** එම ගමනාන්තයේම (එම රටේම) වෙනත් ලිපිනයකට හරවා යැවීමක් සිදු කල යුතු නම් මෙහි ලිපිනය ලිවිය හැක.
(Redirect හරවා යැවීම සම්බන්ධයෙන් වැඩි විස්තර මාතෘකා අංක 09 පිටු අංක 26 යටතේ දැක්වේ.)
- **Return/Redirect – by Surface/ SAL or by Air mail:** නැවත එවිය යුතු සේවාව තෝරා ගැනීම (මෙහි දී මුහුදු හෝ SAL සේවාව තෝරා ඇති නමුත් අදාළ ගමනාන්ත රටෙන් අප රටට එම සේවාවන් නොමැති විටක දී ගුවන් තැපැල භාවිතා කර භාණ්ඩ නැවත එවීම සිදු වේ.)

**මෙම කොටස අනිවාර්යයෙන් පිරවිය යුතු අතර, රඳවා තබා ගැනීම් හා ආපසු එවීම් වල දී ආපසු එවීමේ ගාස්තු අය වන බවත් භාණ්ඩ නැවත භාර දෙන්නේ එම ගාස්තු අය කර ගැනීමෙන් පසු බවත් පාරිභෝගිකයා දැනුවත් කල යුතුය.**
එමෙන්ම, මෙම ගාස්තු එක් එක් රටවල තැපැල් ගාස්තු අනුව මෙම අය කිරීම් වෙනස් වන බවත්, බොහෝ විට භාණ්ඩය තැපැල් කිරීමට වැය වූ තැපැල් ගාස්තුවට වඩා වැඩි ගාස්තුවක් අය විය හැකි බවද, (යවන විදේශ රටේ ගාස්තු අනුව අය වන බැවින්) පාරිභෝගිකයන් දැනුවත් කල යුතුය.
**නැවත ලබාගැනීමට අවශ්‍ය නොවන භාණ්ඩයක් නම් " Treat as Abandoned" තේරීම සුදුසු වේ.**

**CN23 අවසන් පිටපතේ (office copy) යවන්නාගේ ජාතික හැඳුනුම්පත් අංකය / විදේශ ගමන් බලපත්‍ර අංකය අනිවාර්යයෙන් සටහන් කරගත යුතුවේ.**

**යවන්නාගේ වගකීම මත යවන භාණ්ඩයක් නම් ඒ පිළිබඳව පැහැදිළිව CN23 customer copy හා office copy හි සටහන් තබාගත යුතුවේ.(Sender Warned – SW)**

### 4.3 CN23 EMS පිටපත් සඳහා ක්‍රියා කල යුතු ආකාරය

| | | |
|---|---|---|
| 1 පිටපත | Address Label | නොගැලවෙන සේ භාණ්ඩයේ අලවන්න. |
| 2 පිටපත | Customer Receipt | යවන්නාට ලබා දේ.<br>Barcode ඇලවිය යුතුය. |
| 3 පිටපත | Customs Copy | ලිපි බිලට අමුණයි. |
| 4 පිටපත | Dispatch Copy | ලිපි බිලට අමුණයි. |
| 5 පිටපත | Office Copy | ආරම්භක කාර්යාලය ගොනු කර තබා ගනියි.<br>Barcode ඇලවිය යුතුය. |

### 4.4 EMS Barcode භාවිතය

EMS භාණ්ඩ සඳහා වන ලේබල ඉලක්කම් නවයකින් යුතු E අක්ෂරයෙන් ආරම්භ වන ලේබලයක් වන අතර අවසාන අකුරු දෙකෙන් භාණ්ඩය භාරගත් රටෙහි නම හඳුනාගත හැක.

EMS barcode ලේබල් කට්ටලයක ලේබල් 3ක් ඇති අතර එම ලේබල් සඳහා පහත පරිදි කටයුතු කල යුතුය.

| | |
|---|---|
| පළමු ලේබලය | පාර්සලයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. |
| දෙවන ලේබලය | පාරිභෝගිකයාට ලබා දෙන CN23 පිටපතේ ඇලවිය යුතුය. |
| තුන්වන පිටපත | CN23 කාර්යාලීය පිටපතේ ඇලවිය යුතුය. |

- barcode ලේබල ඇලවීමේ දී රැළි නොවැටෙන අයුරින් සුමට මතුපිටක නොගැලවෙන සේ ඇලවිය යුතුය.
- තැපැල් කාර්යාල සිය කාර්යාලයට අවශ්‍ය කරන ප්‍රමාණයට barcode ලේබල් සැපයුම් කාර්යාලය විසින් ගෙන්වා ගත යුතු වන අතර, හා පාලිත උප තැපැල් කාර්යාල වලට ද අවශ්‍ය කරන barcode ප්‍රමාණයට ද සරිලන පරිදි ප්‍රමාණවත් තොග පවත්වාගෙන යා යුතුය.
- barcode ලේබල තොග උප පත්‍රිකා ලේඛනයේ සටහන් තබා ලැබුම් හැඟවුම් සහිතව ලබාගැනීම හා භාරදීම සිදු කල යුතුය.
- උප තැපැල් කාර්යාල සිය අවශ්‍යතාවය අනුව පාලන කාර්යාල යෙන් barcode ගෙන්වා ගත යුතුය.
- අනවශ්‍ය තොග රඳවා ගැනීමෙන් barcode ලේබලවල ගුණාත්මකභාවය අඩු වන බැවින් (ඇලවීමේ හැකියාව හා Scan වීමේ හැකියාව) සෑම විටම අවශ්‍ය පරිදි පමණක් තොග රඳවා තබා ගත යුතුය.
- කල් ඉකුත්වූ ලේබල් විශේෂ උපදෙස් ලබා දී නොමැති විටක දී විගණනය සඳහා ඉදිරිපත් කරන තෙක් සුරක්ෂිතව තබා ගත යුතුය.
- නරක් වූ barcode labels – EMS භාර ගැනීමේ ලේඛනයේ අනුක්‍රමික අංකයට අදාල ස්ථානයේ අලවා (කොටස් 3 ම) අවලංගු කිරීමට හේතුව සඳහන් කර අදාල නිලධාරියාගේ අත්සන් යොදා තිබිය යුතුය.

## 5. EMS භාණ්ඩ ආපසු එවීම. (Return)

මෙරටින් යැවීමට තැපැල් කාර්යාල විසින් භාර ගන්නා EMS භාණ්ඩ පහත අවස්ථා දෙකේ දී ආපසු එවීම් සිදු විය හැක.

### 5.1 මෙරට තුළදීම ආපසු එවිය හැකි අවස්ථා.

1. නිවැරදි ලෙස CN23 පෝරම පුරවා නොතිබීම
2. තහනම් භාණ්ඩ ඇතුළත් වී තිබීම හෝ රෙගුලාසි සහිත භාණ්ඩ යැවීමේ දී අවශ්‍ය ලියකියවිලි ඇතුළත් කර නොතිබීම
3. ප්‍රමාණ හා බර සීමා වලට පටහැනිව භාර ගෙන තිබීම
4. ඇසුරුම ප්‍රමාණවත් නොවීම
5. ලිපිනයන් අඩුපාඩු සහිත වීම, සේවාව ක්‍රියාත්මක නොවන ගමනාන්ත වලට භාණ්ඩ භාර ගෙන තිබීම

### 5.2 ගමනාන්ත රටට ගොස් ආපසු එවිය හැකි අවස්ථා

ඉහත 5.1 හි 1,2,3 අවස්ථාවලට අමතරව,

1. ලිපිනයන් නිවැරදි නොවීම
2. භාරදීමට කරන ලද උත්සාහයන්ට පසුව භාරදිය නොහැකි වූ විටක දී
3. පාරිභෝගිකයාගේ ඉල්ලීමට අනුව
4. අදාළ ලියකියවිලි සහිතව යැවූ වද ගමනාන්ත රටෙහි රේගුව විසින් නතර කර නැවත එවීමට තීරණය කරන අවස්ථාවක දී

විදේශයන් ගෙන් EMS භාණ්ඩ ආපසු එවීමක් සිදු කරන විට CN15 නම් වූ නැවත එවීමට හේතු සඳහන් පෝරමය භාවිතා කරනු ලබයි.

***විශේෂ උපදෙස්:***

- මෙරටින් යවන EMS තැපැල් භාණ්ඩ ගමනාන්තයේ දී ලබන්නා වෙත භාර දීමට නොහැකි වූ විටක දී ආපසු ගෙන්වා ගැනීමට අවශ්‍ය ද යන්න CN 23 පෝර්මයේ අදාළ ස්ථානයේ යවන්නා ලවා සටහන් කරවා ගත යුතු වේ.
- ඇතැම් ගමනාන්තයන් විසින් මෙසේ ආපසු එවීමේ දී ගාස්තුවක් අය කරනු ලබන අතර එය පාරිභෝගිකයා විසින් CN23 හරහා කරන ලද ඉල්ලීමකට පරිදි එවන ලද්දක් නම් ඒ සඳහා ගමනාන්තයන් විසින් අය කරනු ලබන ගාස්තු ගෙවා භාණ්ඩය භාර ගැනීමට සිදු වන බව CN23 පුරවන අවස්ථාවේ දී පාරිභෝගිකයා දැනුවත් කල යුතුය.

### 5.3 ආපසු එවීම් සඳහා ගාස්තු අය කරන රටවල් ලැයිස්තුව සහ අය කරන ගාස්තු ප්‍රමාණය.

2026-03-10 දිනට යාවත්කාලීන වූ තොරතුරු ඇතුලත් ලැයිස්තුව පහත දක්වා ඇත. මෙම ලැයිස්තුවේ තොරතුරු යාවත්කාලීන විය හැකි බැවින් එසේ වන විටක දී එය චක්‍රලේඛ හෝ වෙබ් පුවතක් ලෙස දැනුවත් කරනු ලැබේ.

| Country | How many delivery attempts | Redirect to new address | Return the items | Return Charges (SDR) | Other |
|---|---|---|---|---|---|
| Argentina | 2 | No | No | | |
| Australia | 1 | Yes | Yes | 20.185 | |

| | | | | | |
|---|---|---|---|---|---|
| Austria | 1 | No | No | 9.75 | |
| Bahrain | 2 | Yes | Yes | | |
| Bangladesh | - | No | No | 14.75 | |
| Belgium | 1 | No | No | | |
| Brazil | 3 | No | No | | |
| Canada | 1 | No | No | | |
| China | 2 | No | No | | |
| Cyprus | 1 | Yes | Yes | | |
| Czech Republic (Czechia) | 1 | No | No | | |
| Denmark | 1 | No | Yes | | |
| Egypt | 3 | No | No | | |
| Finland | 1 | No | No | | |
| France | 1 | No | Yes | | |
| Germany | 1 | No | No | | |
| Greece | 2 | No | Yes | | |
| Hong Kong | 1 | No | No | | |
| Hungary | 2 | Yes | No | | |
| India | 2 | No | Yes | | |
| Indonesia | 2 | Yes | Yes | | |
| Ireland | 1 | No | No | | |
| Israel | 2 | Yes | Yes | 11.0 | |
| Italy | 2 | No | Yes | 7.01 | Return charges + cost of transport |
| Japan | 1 | Yes | Yes | 19.15 | |
| Jordan | 3 | Yes | Yes | | |
| Kenya | 2 | No | No | | |
| Korea (Rep.) | 2 | Yes | Yes | | |
| Kuwait | 3 | No | No | | |
| Latvia | 2 | Yes | Yes | | |
| Luxembourg | 1 | No | No | | |
| Malaysia | 1 | No | No | | |
| Maldives | 2 | No | No | | |
| Myanmar | 2 | Yes | Yes | 8.0 | |
| Nepal | 2 | Yes | Yes | | |
| Netherlands | 1 | No | No | | |
| New Zealand | 2 | Yes | No | 14.59 | based on destination zones: for Asia 14.590 per item |
| Norway | 1 | No | No | | |
| Oman | 2 | Yes | Yes | | |
| Pakistan | 2 | Yes | Yes | | |
| Philippines | 2 | Yes | Yes | | |
| Poland | 1 | Yes | Yes | | |
| Portugal | 1 | No | No | 7.0 | |
| Qatar | 3 | Yes | Yes | | |
| Russia | 2 | Yes | Yes | 7.0 | |
| Saudi Arabia | 3 | Yes | Yes | 8.0 | |
| Seychelles | 3 | No | No | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| Singapore | 3 | No | Yes | | |
| South Africa | 3 | No | No | | |
| Spain | 2 | No | No | | |
| Sweden | 1 | No | No | | |
| Switzerland | 1 | Yes | No | | |
| Thailand | 2 | Yes | Yes | 2.14 SDR/item + 6.68 SDR/Kg | 2.14 SDR per item and 6.68 SDR per 1Kg |
| Türkiye | 2 | No | No | 4.5 | Return charges + Cost of Transport (Transport Rate x Kg) |
| United Arab Emirates | 3 | Yes | Yes | | |
| United Kingdom of Great Britain | 2 | Yes | No | | |
| United States of America | 1 | No | No | | |
| Viet Nam | 2 | Yes | Yes | | |

*Source : EMS Operational Guide 2026-3-10*

**How many delivery attempts (බෙදීම් උත්සාහයන් දරන වාර ගණන):** එක් එක් තැපැල් පරිපාලනයන් සිය මෙහෙයුම් ක්‍රියාවලිය අනුව EMS භාණ්ඩයක් බෙදීමට උත්සහ දරන වාර ගණන මෙම කොටසින් දැක්වේ. එක් වාරයක් පමණක් බෙදීම් උත්සාහයන් දරන රටකට EMS භාණ්ඩ යවන අවස්ථාවේ දී ඒ පිළිබඳව යවන්නා දැනුවත් කිරීම තුළින් භාණ්ඩ බෙදීමට නොහැකිව ආපසු පැමිණීමෙන් සිදු වන අපහසුතා මඟ හරවා ගත හැක.

**Redirect to new address (වෙනත් ලිපිනයකට හරවා යැවීම):** EMS භාණ්ඩ වෙනත් ලිපිනයකට හරවා යැවීමේ සේවාව සපයන රටවල් මෙම කොටසේ දැක්වේ. මෙම සේවාව පිළිබඳ වැඩි විස්තර 06 මාතෘකාව ඔස්සේ දක්වා ඇත.

**Return the Item (ආපසු එවීම):** EMS අයිතම ආපසු එවීමේ සේවාව සිදු කරන රටවල් මෙම කොටසින් දැකිය හැක. අයිතම ආපසු එවන ලෙස ඉල්ලීම් කල හැක්කේ එම සේවාව ලබා දෙන රටවල් වලින් පමණි. නමුත් රේගු සම්බන්ධ ගැටළු වල දී අයිතම නැවත එවනවාද නැතිද යන්න පිළිබඳව තීරණය කිරීමේ හැකියාව අදාළ රටේ රේගුව සතු වේ.

**Return Charges (ආපසු එවීම සඳහා වන ගාස්තු):** අයිතම ආපසු එවන විටක දී ගාස්තු අයකරන රටවල් මෙම කොටසින් දැක්වේ. මෙම ගාස්තු SDR වලින් අයකරන අතර, **2026 වර්ෂය සඳහා SDR 1 ක අගය රු. 407.36ක් වේ.**

**Other (වෙනත්):** අයිතමයකට අය කරන ගාස්තුවට අමතරව බර, ප්‍රදේශය, ප්‍රවාහන ගාස්තු වැනි ගාස්තු අය කරන රටවල් මෙම කොටසින් දැක්වේ.

## 6. EMS භාණ්ඩ වෙනත් ලිපිනයකට හරවා යැවීම (Re-Direction)

EMS භාණ්ඩ විදේශයන් වෙත යැවීමෙන් අනතුරුව එම භාණ්ඩය තැපැල් කරන අවස්ථාවේ සඳහන් කරන ලද ලිපිනය වෙත නොව එම ගමනාන්තයේම වෙනත් ලිපිනයකට යවන මෙන් ඉල්ලූ විටක දී පහත කරුණු සැලකිල්ලට ගත යුතුය.

- EMS හරවා යැවීමට වන ඉල්ලීම ගමනාන්ත රටේම වෙනත් ලිපිනයකට විය යුතුය.
- EMS භාණ්ඩය බෙදීමට හෝ ආපසු එවීමට ප්‍රථම ඉල්ලීම කල යුතුය.
- භාණ්ඩය තැපැල් කිරීමේදී CN 23 භාර දුන් පාරිභෝගිකයා (යවන්නා) විසින්ම ලිපියකින් තම ඉල්ලීම CN 23 මුල් පිටපත සමඟ ආරම්භක කාර්යාලයේ තැපැල් ස්ථානාධිපති වෙත ඉදිරිපත් කල යුතුය. (ගාස්තු මුද්දර මඟින් අයකර ඉල්ලීම් ලිපියේ අලවා අවලංගු කල යුතුය.)
- එම ලිපිය යවන්නා විසින් ඉදිරිපත් කරන ලද ලියවිල්ලක් බව ආරම්භක කාර්යාලයේ තැපැල් ස්ථානාධිපති විසින් සහතික කර, පිටපතක් කාර්යාලයේ තබා ගැනීමෙන් පසු මධ්‍ය තැපැල් හුවමාරුවේ EMS අංශයේ තැපැල් ස්ථානාධිපති වෙත email/ සේවා පුවතක් මඟින් ඉදිරිපත් කල යුතුය. (ems.colombo@yahoo.com / ems@slpost.lk )
- මධ්‍ය තැපැල් හුවමාරුවේ දී EMS අංශයේ තැපැල් ස්ථානාධිපති විසින් CN17 පෝරමයක් භාවිතා කර අදාළ රට හැකි ඉක්මනින් දැනුවත් කල යුතුය.
- මධ්‍ය තැපැල් හුවමාරුවේ EMS අංශයට පැමිණෙන පාරිභෝගිකයෙකුට CN17 පෝරමය පුරවා අදාළ ගාස්තු ගෙවීමෙන්ද මෙම සේවාව ලබාගත හැක.
- ලිපිනය වෙනස් කිරීමේ ගාස්තුව රු.610/- කි. (චක්‍රලේඛ අංක: තැපැල්පති චක්‍රලේඛ 11/2022 : Postage circular 2022)
- විදේශයකින් තැපැල් කල භාණ්ඩයක් නම්, ලිපිනය වෙනස් කිරීමකට අදාළ රටේ තැපැල් පරිපාලනයට CN17 පෝරමයක් පුරවා දිය යුතු අතර එය එම අදාළ තැපැල් පරිපාලනය විසින් අප වෙත දන්වනු ඇත.

EMS හරවා යැවීමේ ඉල්ලීම් (Re-Direction) භාර ගත හැක්කේ ඉහත 5.3 කොටසේ වගුවෙහි Redirect to new address සේවාව සපයනවා යැයි සඳහන් කර ඇති රටවල් සඳහා පමණි.

(5.3 කොටසේ දක්වා ඇත්තේ 2026-03-10 දිනට යාවත්කාලීන වූ තොරතුරු වන අතර, එම තොරතුරු යාවත්කාලීන විය හැකි බැවින් එසේ වන විටක දී එය චක්‍රලේඛ හෝ වෙබ් පුවතක් ලෙස දැනුවත් කරනු ලැබේ.)

## 7. EMS භාණ්ඩ සඳහා වන තැපැල් ගාස්තු ආපසු ගෙවීම. (Refund)

විදේශ ගමනාන්තයන් වෙත තැපැල් කාර්යාලයේ දී හෝ මධ්‍ය තැපැල් හුවමාරුවේ දී භාරගන්නා ලද EMS භාණ්ඩ සඳහා පහත කරුණු මත (භාණ්ඩ ගමනාන්ත රටට නොයවා ආපසු යැවීමකදී) යවන්නා විසින් සිය භාණ්ඩය වෙනුවෙන් දැරූ තැපැල් ගාස්තුව ආපසු ලබා දෙන මෙන් ඉල්ලීමක් ලබා දිය හැකිය.

- ක්‍රියාත්මක ගුවන් ගමනාන්ත ලැයිස්තුවේ නොමැති රටකට හෝ ගමනාන්තයකට භාරගන්නා ලද භාණ්ඩයක් ඉදිරියට යැවීමට නොහැකිව ආපසු යවන්නා වෙත ලැබීම.
- හදිසි තත්ත්ව මත ගුවන් ගමන් සීමා වීමකදී, භාණ්ඩ ඉදිරියට නොයැවීම මත ආපසු යවන්නා වෙත භාණ්ඩ ලැබීම.
- මධ්‍ය තැපැල් හුවමාරුව හෝ කටුනායක ගුවන්තොටුපල X Ray Scan පරීක්ෂාවෙන් පසු ප්‍රතික්ෂේප වී භාණ්ඩය ආපසු යවන්නා වෙත ලැබීම.
- විදේශ තැපැල් මෙහෙයුම් අඩපණ වූ අවස්ථාවකදී ආපසු යවන්නා වෙත භාණ්ඩ ලැබීම.
- යවන්නාගේ ඉල්ලීමක් මත විදේශ රට වෙත නොයවා ආපසු භාරදීම. (ආපසු භාර දෙන්නේ යවන්නාගේ ඉල්ලීම මත නම් ඉල්ලීම් ලිපිය මත රු.610/-ක මුද්දර අලවා අවලංගු කර තැපැල් කල භාණ්ඩයක් ආපසු ලබාදීමට අදාළ ක්‍රියාමාර්ගය අනුගමනය කල යුතුය.)
- තැපැල් ගාස්තු ආපසු ගෙවීම සඳහා කරන ඉල්ලීම සමඟ යවන්නා වෙත ලබා දුන් CN 23 පෝරමය (Barcode Label සහිත) ලබාගන්න. යවන්නාගේ අවශ්‍යතාවය මත එහි ඡායා පිටපතක් තබා ගැනීමට උපදෙස් ලබා දෙන්න.

මෙම කරුණු මත පාරිභෝගිකයාට තැපැල් ගාස්තු ආපසු ගෙවීම සඳහා වන පියවරයන් 2024.03.16 තැපැල්පති චක්‍රලේඛ අංක 06/2024 දරණ Refund postage/stamps fees of EMS, Foreign Parcel, Foreign Registered letters and u packets චක්‍රලේඛය අනුව කටයුතු කරන්න.

## 8. භාර ගත් EMS භාණ්ඩ පිටත් කිරීම හා මළු වැසීම

- EMS භාරගැනීම සඳහා කාර්යාලීය ලේඛනයක් පවත්වාගත යුතුය.
- **සෑම විටම Local IPS System මෘදුකාංගය හරහා භාණ්ඩ භාර ගැනීම සිදු කල යුතුය. (Local IPS Guide Book හි මාතෘකා අංක 4 බලන්න.)**
- පද්ධතිගත කල EMS භාණ්ඩ ලැබුම් හැඟවුම් සහිතව තැපැල් ලිපිකරුට භාර දිය යුතුය.
- භාණ්ඩ පරිගණක ගත කර ලැබෙන මුද්‍රිත පෝරමය (භාරගත් භාණ්ඩ පද්ධතිගත කරන ආකාරය දැන ගැනීමට Local IPS Guide Book මාතෘකා අංක 5 බලන්න.) හෝ EMS අංක ඇතුළත් කර සකස් කල ලිපි බිලක් භාවිතා කර මළු වැසිය යුතුය.
- ලිපි බිල හි "EMS COLOMBO" ලෙස සටහන් කල යුතුය.
- කර ලේබලය "EMS" ලෙස නම් කල යුතු අතර පද්ධතිය හරහා මළු වැසීමේ දී ලබා දුන් neck label barcode අංකය නොගැලවෙන හා රැළි නොවැටෙන සේ ඇලවිය යුතුය. neck label barcode අංකය ලෙස 2026-01-16 දිනැති චක්‍රලේඛ අංක Post/HQ/OP/IPS/I-Trc/02/2025 මඟින් හඳුන්වා දුන් විදේශ තැපැල් මළු වැසීම් සඳහා වූ විශේෂ barcode ලේබලය (**RZ** - නිල් පැහැති barcode) භාවිතා කල යුතුය.
- භාරගත් EMS භාණ්ඩ පළමු තැපෑලෙන්ම පිටින් යවන මල්ලක්/මළු (Outside bags) වශයෙන් මධ්‍ය තැපැල් හුවමාරුවේ EMS මධ්‍යස්ථානය වෙත යැවිය යුතුය.

# 9. EMS භාණ්ඩ බෙදීම

## 9.1 බෙදීම් සම්බන්ධ ප්‍රමිතීන්

බෙදන EMS අයිතම සඳහා ආරම්භක රටවල් විසින් Pay For Performance (PFP) ලෙස බෙදීම් ගාස්තුවක් ලබා දේ. එනම්, මෙම ගාස්තුව **බෙදීම් ක්‍රියාවලියේ කාර්ය සාධනය මත** අප විසින් උපයා ගත යුතු ආදායමකි. මෙම ගෙවීම් උපයා ගැනීමට නම්, EMS භාණ්ඩයේ බෙදීම ප්‍රමිතියකට කරන බෙදීමක් විය යුතුය. 2025-02-01 වන විට අප වෙත ගෙවනු ලබන ගාස්තුව SDR 7වේ. (2026 වර්ෂයේ SDR අනුපාතය SDR1= රු.407.36කි.)

### ශ්‍රී ලංකාව තුළ EMS අයිතම සඳහා වන බෙදීම් ප්‍රමිතීන්

ගමනාන්ත ගුවන් තොටුපළේ සිට ගමනාන්ත ලිපිනයට භාණ්ඩය බෙදීම දක්වා ගත කල යුතු කාලය

| Day<br>දිනය | Cut-off time | EMD Scan cut-off time<br>(ප්‍රධාන හුවමාරු මධ්‍යස්ථානයට ඇතුළුවීම ස්කෑන් කිරීමේ කඩඉම් කාලය) | Zone 1 | Zone 2 | Zone 3 | Zone 4 |
|---|---|---|---|---|---|---|
| Monday | 00:00 - 07:00 | 11:00 | Mon | Tue | Wed | Thu |
| | 07:01 - 23:59 | 23:59 | Tue | Wed | Thu | Fri |
| Tuesday | 00:00 - 07:00 | 11:00 | Tue | Wed | Thu | Fri |
| | 07:01 - 23:59 | 23:59 | Wed | Thu | Fri | Sat |
| Wednesday | 00:00 - 07:00 | 11:00 | Wed | Thu | Fri | Sat |
| | 07:01 - 23:59 | 23:59 | Thu | Fri | Sat | Mon |
| Thursday | 00:00 - 07:00 | 11:00 | Thu | Fri | Sat | Mon |
| | 07:01 - 23:59 | 23:59 | Fri | Sat | Mon | Tue |
| Friday | 00:00 - 07:00 | 11:00 | Fri | Sat | Mon | Tue |
| | 07:01 - 23:59 | 23:59 | Sat | Mon | Tue | Wed |
| Saturday | 00:00 - 07:00 | 11:00 | Sat | Mon | Tue | Wed |
| | 07:01 - 23:59 | 23:59 | Mon | Tue | Wed | Thu |
| Sunday | 00:00 - 23:59 | 23:59 | Mon | Tue | Wed | Thu |

Zone 1 – **කොළඹ කලාපය (1-15)**
Zone 2 – **කොළඹ අවට කලාපය**
Zone 3 – **ගම්පහ, කළුතර දිස්ත්‍රික්ක**
Zone 4 – **දිවයින පුරා සෙසු පළාත්**

ඉහත ප්‍රමිතීන්ට අනුව භාණ්ඩය ගුවන්තොටුපළින් භාරගන්නා වෙලාව අනුව එය බෙදීම් හෝ බෙදීමට උත්සාහ කිරීම් සිදු කළ යුතු කාලය කලාප 4කට වර්ගීකරණය කර ඇත.

ශ්‍රී ලංකාව තුළ ඉරිදා දිනය බෙදීම් දිනයක නොවන අතර, සාපේක්ෂව කොළඹින් පිට පළාතක සිදු කරන බෙදීමක් නම්, භාණ්ඩය ගුවන්තොටුපළින් භාරගත් වෙලාවේ සිට දින 4ක් ඇතුළත බෙදීම් කටයුතු සිදු කල යුතුය. (බෙදීම් සඳහා පළමු සාර්ථක උත්සාහය දැරීම)

**මීට අමතරව ඉහත භාණ්ඩ බෙදීම් පිළිබඳ තොරතුරු,**

- **භාණ්ඩය බෙදීම් කාර්යාලයට ලැබුන දිනයේ ලැබුන වෙලාවේදීම (EMG අවස්ථාව) එය පද්ධතියට ඇතුළත් කල යුතුය.**
- **භාණ්ඩය බෙදීම (EMI) හෝ බෙදීමට උත්සාහ කල බවට (EMH) දත්ත එදිනම (පැය 24ක් ඇතුළත) පද්ධතියට ඇතුළත් කල යුතුය.**
- **රේගු බදු අය කර ගැනීම සඳහා ශ්‍රී ලංකා රේගුව විසින් රඳවා ගන්නා පාර්සල් වෙනුවෙන් ලැබෙන පෝරම (Notice) හැකි ඉක්මනින් බෙදීම සිදු කල යුතු අතර ඒවා භාණ්ඩ බෙදීමක් සේ සලකා Local IPS පද්ධතියට ඇතුළත් නොකල යුතුය.**

Line පාර්සල් ක්‍රමවේදය ඔස්සේ රේගුවෙන් රඳවා ගත පාර්සල් තැපැල් කාර්යාලයට ගෙන්වා ගැනීමට ලබන්නා විසින් ඉහත පෝරම පුරවා දුන් අවස්තාවල දී ඒවා නිවැරදි ලෙස පුරවා ඇති දැයි පරික්ෂා කර බැලිය යුතුය.

EMS සේවාවේ දී Local IPS System (එනම් IPS.POST හා CDS.POST පද්ධති) හරහා හුවමාරු කර ගන්නා තොරතුරු භාවිතා කර tracking පහසුකම ලබා දීම පමණක් නොව, රටවල් අතර වාර්තා ලබාගැනීම, කාර්යසාධනය මැනීම හා ආදායම් ගණනය කිරීම වැනි දෑ සඳහා දත්ත උපයෝගී කර ගන්නා බැවින් මධ්‍ය තැපැල් හුවමාරුව, තැපැල් කාර්යාල මෙන්ම උප තැපැල් කාර්යාල සිය භාණ්ඩ භාර ගැනීම් බෙදීම් කටයුතු Local IPS system හි ඇතුළත් කිරීම ඉතා වැදගත් වේ.

භාණ්ඩ හුවමාරු ක්‍රියාවලියේ ඇති දුර්වලතා හා අදාළ දිනයේදීම භාරගත් හා බෙදීම් කරන ලද භාණ්ඩ වල දත්ත පද්ධතියට ඇතුළත් නොකිරීම හේතුවෙන් 2024 වන විට EMS සඳහා විදේශයන් ගෙන් ලබන ආදායමට කාර්යසාධනය මත ලැබෙන ආදායම එකතු වූයේ ඉතා අඩු ප්‍රතිශතයකි. නමුත් Local IPS system හඳුන්වා දීමත් සමඟ, On time Delivery, On time transmission තත්වයන් සාධනීය මට්ටමකට ළඟා කර ගැනීමත් සමඟ මෙම ප්‍රතිශතය ඉහළ නංවා දෙපාර්තමේන්තුවට වැඩි විදේශ ආදායමක් ලබා ගැනීමට බලාපොරොත්තුවේ.

### 9.2 EMS අයිතම බෙදීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු

- බෙදීම සඳහා කාර්යාලයට ලැබෙන EMS අයිතම සඳහා ප්‍රමුඛතාවයක් ලබා දිය යුතු මෙන්ම භාණ්ඩ වල ආරක්ෂාව පිළිබඳව සැලකිලිමත් විය යුතු වේ.
- භාණ්ඩය කාර්යාලයට ලැබුණු දිනයේදීම ඒ පිළිබඳව තොරතුරු Local IPS System ඇතුළත් කල යුතුය. (EMG අවස්ථාව)
- තම කාර්යාලයට වරදවා ලැබුණු භාණ්ඩයක් නම්, එම භාණ්ඩය නිවැරදි ගමනාන්තයට හැකි ඉක්මනින් පිටත්කළ යුතු අතර, භාණ්ඩය තම කාර්යාලයට ලැබීම හා නිවැරදි කාර්යාලයට පිටත් කිරීම පිළිබඳව තොරතුරු Local IPS පද්ධතියට ඇතුළත් කල යුතුය.
- EMS භාරදීම් ලේඛනයක් පවත්වාගත යුතු අතර තැපැල්කරුට ලබාදීමේ දී ලැබුම් හැඟවුම් සහිතව ලබා දිය යුතුය.
- බෙදීමට යැවීමට පෙර අදාළ භාණ්ඩයේ ලබන්නාගේ දුරකථන අංකයක් සඳහන් වේ නම් එය බෙදීම් සඳහා රැගෙන එන බවට දුරකථනයෙන් දැනුම් දීම සුදුසු වේ.
- හැකි සෑම විටම ප්‍රමිතීන්ට අනුව අදාළ ලිපිනයට බෙදීම සිදුකල යුතු අතර ලබන්නා ගේ අවශ්‍යතාවය අනුව තැපැල් කාර්යාලය වෙත පැමිණ හෝ භාර ගත හැකිය.

- තැපැල්කරු විසින් භාණ්ඩය භාරදීමේ දී පහත තොරතුරු සහිතව භාණ්ඩය භාරදීම අත්‍යාවශ්‍ය බව තැපැල්කරුවන් දැනුවත් කල යුතුය.

    - ලබන්නා විසින් භාර ගත් දිනය හා වේලාව
    - ලබන්නා/භාර ගන්නා අයගේ අත්සන
    - ලබන්නා/භාර ගන්නා අයගේ  මුල් නම හා වාසගම සහිතව නම
    - ලබන්නා/භාර ගන්නා අයගේ ජාතික හැඳුනුම්පත් අංකය (විදේශිකයෙකු නම් විදේශ ගමන් බලපත්‍ර අංකය)

- EMS භාණ්ඩය බෙදීම සඳහා 2 වරක් උත්සාහ කල යුතු අතර, පළමු අසාර්ථක උත්සාහයේ දීම දැන්වීමක් (POK18 පෝරමය) නිකුත් කළ යුතුය.
- බෙදීම් අසාර්ථක වීමට හේතුව භාණ්ඩයේ පැහැදිළිව සටහන් තබා තිබිය යුතු අතර එය අනිවාර්යයෙන් එදිනම බෙදීමට උත්සාහකිරීමක් ලෙස (EMH අවස්ථාව) Local IPS System හි අදාළ හේතුව සහිතව ඇතුළත් කල යුතුය.
- සාර්ථක බෙදීමක් නම් එයද එදිනම Local IPS System හි අදාළ තොරතුරු සහිතව ඇතුළත් කල යුතුය.
- EMS භාණ්ඩ ගුදම් ගාස්තුවකින් තොරව දින 5ක් කාර්යාලයේ රඳවා ගත යුතුය. පාරිභෝගිකයාගේ ලිඛිත ඉල්ලීමක් පරිදි ගුදම් ගාස්තු අය කිරීමකට යටත්ව ඉහත දින 5ට අමතරව තවත් දින 10 (එකතුව 15) දක්වා භාණ්ඩ කාර්යාලයේ රඳවා තබා ගත හැක.
- බෙදීමට නොහැකි වූ භාණ්ඩ ආපසු එවීමට පෙර ලිපි හිමි (ලබන්නා) දුරකථන අංක ඔස්සේ සම්බන්ධ කරගෙන භාර නොගන්නා බව තහවුරු කරගැනීමට හැකි සෑම උත්සාහයක්ම දැරිය යුතුය.
- බෙදීමට නොහැකි වීමට හේතුව භාණ්ඩයේ පැහැදිළිව සටහන් තබා තිබිය යුතුය.
- **බෙදීමට නොහැකි වූ භාණ්ඩ Local IPS System හි දත්ත ඇතුළත් කිරීමෙන් අනතුරුව පිටත මල්ලක් සේ වසා මධ්‍ය තැපැල් හුවමාරුවේ EMS අංශය වෙත එවීම කල යුතුය.**

***(Local IPS System දත්ත ඇතුළත් කිරීම පිළිබඳ පියවරයන් සඳහා Local IPS System අත්පොත පරිහරණය කරන්න)***

### 9.3 පළුදු වී/ අලාභ හානි වී ලැබෙන EMS භාණ්ඩ පිළිබඳ ක්‍රියා කිරීම

පළුදු වී/අලාභ හානි වී ලැබෙන EMS භාණ්ඩයක ඇත්තේ සුළු පළුදු වීමක් නම් POI 23 දරන ආරක්ෂිත ලේබල (පිරියම් ලේබලයක්) අලවා සුරක්ෂිත කල හැකි අතර හානිය විශාල නම් ආරක්ෂිත කවරයක බහා මුද්‍රා තැබිය යුතුය.මෙම භාණ්ඩ බෙදීම සඳහා නොයැවිය යුතු අතර ලබන්නා වෙත දන්වා කාර්යාලයට ගෙන්වා ගෙන භාරදීම සිදු කර යුතුය. භාරදීමේ දී අදාළ සටහන් සහිතව භාරදිය යුතු අතර, මෙරට හානිවී හෝ පළුදු වී ලැබෙන තැපැල් භාණ්ඩයක් සඳහා අනුගමනය කරන ක්‍රියා මාර්ගයන්ම අනුගමනය කල යුතු වේ. එමෙන්ම යම් අක්‍රමිකතාවයක් නොවීමටද පාරිභෝගිකයා විසින් පැමිණිල්ලක් ඉදිරිපත් කරන්නේ නම් ඒ සඳහා ක්‍රියා කිරීමට සුදුසු පරිදි භාරදීම සිදු කල යුතුය.

## 10. EMS භාණ්ඩ සම්බන්ධයෙන් වන විමසීම් හා පැමිණිලි

### 10.1 විමසීම්

EMS භාණ්ඩයක් තැපෑලට යොමු කර ඉරිදා දින හා ප්‍රසිද්ධ නිවාඩු දින හැර දින 7ක් ගත වන තුරු ද එය ගමනාන්තයට ලැබී නොමැති නම් අදාළ භාණ්ඩය පිළිබඳව තැපැල්/උප තැපැල් කාර්යාලයකින්, මධ්‍ය තැපැල් හුවමාරුවේ EMS අංශයෙන් හෝ 1950 ක්ෂණික විමසීම් අංකය හරහා විමසීමක් සිදු කරන ලෙසට භාණ්ඩය භාර ගන්නා අවස්ථාවේදීම පාරිභෝගිකයා දැනුවත් කල යුතුය.

#### 10.1.1 EMS භාණ්ඩයක් පිළිබඳව තොරතුරු දැන ගත හැකි අවස්ථා

**පවත - Tracking දැන ගැනීමට නම්,**

පාරිභෝගිකයන්ට :
Global Track and Trace වෙබ් අඩවිය හරහා
Local IPS System හි ලියාපදිංචි වී ඇති පාරිභෝගිකයෙකු නම් සිය ගිණුමට logging වීමෙන්ද,

තැපැල්/උප තැපැල් කාර්යාලයේ දී නම් Local IPS System හරහා ද මූලික තොරතුරු දැන ගත හැක.

**වැඩිදුර විමසීමක් සඳහා නම්,**


- මධ්‍ය තැපැල් හුවමාරුවේ EMS විමසීම් අංශයට (EMS Inquiry) අමතා හෝ තැපැල් මූලස්ථානයේ ජාත්‍යන්තර තැපැල් සේවා අංශය අමතා තොරතුරු ලබාගත හැක.
- මෙහිදී සිදු කරන විමසීම යම් භාණ්ඩයක් සම්බන්ධයෙන් විදේශ තැපැල් පරිපාලනයකින් සිදු කළ යුතු විමසීමක් නම්, මධ්‍ය තැපැල් හුවමාරුවේ EMS විමසීම් අංශය වෙත දැනුම් දිය යුතුය.
- මෙවැනි විමසීම් විශ්ව තැපැල් සංගමය EMS සේවාව වෙනුවෙන් හඳුන්වා දී තිබෙන විශේෂ විමසීම් ක්‍රමවේදය (i-Care පද්ධතිය) ඔස්සේ අදාළ විමසීම කරනු ඇත.
- මෙම විමසීම් වල ස්වභාවය අනුව රටවල් විසින් පිළිතුරු ලබාදීමේ කාලය පද්ධතිය විසින් තීරණය කරනු ලැබේ. (සාමාන්‍ය විමසීමක දී බොහෝ විට දින 1ත් 10ත් අතර කාලයක් ගත විය හැක.)

## 11. පැමිණිලි

- EMS තැපැල් භාණ්ඩ සම්බන්ධයෙන් පැමිණිලි භාර ගත හැක්කේ භාණ්ඩය තැපැලට භාර ගත් දිනයේ සිට මසක් ඇතුළත පමණි.
- ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයකට පැමිණිල්ලක් භාර දිය හැකි අතර EMS පැමිණිලි සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකර හැකි ඉක්මනින් ක්‍රියා කල යුතුය.
- ඇතැම් රටවල වෙබ් අඩවි හා පද්ධති වලින් ප්‍රමාද වී තොරතුරු ලබා ගැනීමට අපහසු බැවින්, ප්‍රමාදවී ඉදිරිපත් කරන පැමිණිලි ඇතැම් ගමනාන්තයන් වෙතින් භාර නොගැනීමට ඉඩ ඇත.
- පාරිභෝගිකයෙකු EMS භාණ්ඩයක් හෝ අස්ථාන ගතවීමක් හෝ වෙනත් සිදුවීමක් වෙනුවෙන් කරන පැමිණිල්ලක් නම් POK60 පෝරමයක් (ලියාපදිංචි කල හෝ රක්ෂණය කල හෝ භාණ්ඩ පිළිබඳ විමසීම් පෝරමය) පුරවා පැමිණිල්ල භාර ගත යුතුය.
- භාරගන්නා පැමිණිලි තම කාර්යාලයේ භාරගත් භාණ්ඩයක් නම් ඒ පිළිබඳව විස්තර ඇතුළත් කර පැමිණිල්ල පිළිබඳව සටහන් තබාගෙන නොපමාව ඉදිරියට එවිය යුතුය.
- පැමිණිල්ල වෙනත් කාර්යාලයකින් භාර ගත් භාණ්ඩයක් සඳහා වේ නම්, පැමිණිල්ල භාර ගෙන දින මුද්‍රා තබා පළමු තැපෑලෙන්ම අදාළ භාර ගැනීම් තැපැල් කාර්යාලය වෙත යැවිය යුතුය.

### 11.1 POK60 - විමසීම් පෝරමය පිරවීම.

- අදාළ EMS භාණ්ඩයේ CN23 කුවිතාන්සි යේ පාරිභෝගිකයාගේ පිටපත (customer copy) POK60 පෝරමය සමඟ අනිවාර්යයෙන් අමුණා තිබිය යුතුය.
  **(මෙමගින් තැපැල්පති චක්‍රලේඛ 06/2024 හි පළමු පියවරෙහි සඳහන් CN23 සහතික කල පිටපත ප්‍රමාණවත් බව සඳහන් වන කරුණ සංශෝධනය වන බව සලකන්න)**
- පාරිභෝගිකයාගේ පිටපත ලබාගන්නා බැවින් එහි ඡායා පිටපතක් මුල්පිටපත භාරගත් ලෙස සහතික කර පාරිභෝගිකයාගේ ඉල්ලීම පරිදි ඔහු වෙත ලබාදිය හැක.
- POK 60 පිරවීමේ දී පෝරමයේ අංක 8. 'පැමිණිලිකරුගේ නම හා ලිපිනය" යන ස්ථානයේ, පැමිණිලිකරු සම්බන්ධ කර ගත හැකි දුරකථන අංක ලබාගැනීම අනිවාර්යය වේ.
- EMS භාණ්ඩයේ ඇතුළත් ද්‍රව්‍ය වෙනුවෙන් තැපැල් කිරීමේ දී විශේෂ සහතිකයක්, බලපත්‍රයක් හෝ නිර්දේශයක් අඩංගු කලේ නම් ඒ පිළිබඳව අංක.4 "අඩංගු දෑ හා එහි වටිනාකම යන ස්ථානයේ" සටහන් තැබිය යුතුය.



P.O.K
INQUIRY REGARDING REGISTERED OR INSURED ARTICLE

Particulars of Article Posted

1. Date of Posting and Office ……
2. Registered No ……
3. Name and address of recipient ……
4. Contents and their value ……
5. Value of stamps affixed ……
6. If insured, amount insured for ……
7. Sender's name and address ……
8. Name and address of complainant ……
9. Date ……
10. Signature of complainant ……

Office use only

Despatching Office ……

Postmaster ……


Above article …… was despatched to your office by registered List No ……

entered as item …… by my closing on ……

Postmaster

Date : ……

Office : ……



Transit Office : ……

Postmaster : ……

Postmaster : ……

Date …… Office : ……

Office of Delivery

Postmaster ……

Above article delivered to the addressee on …… under pink receipt No. ……

If undelivered state disposal

Postmaster

Date : ……

ලොව පුරාම ප්‍රමුඛ තැපැලක් ලෙස සැලකෙන **EMS** සේවාව වෙනුවෙන් මෙරටට ලැබෙන භාණ්ඩ වල බෙදීම් සනාථ කරන මෙන් හෝ වෙනත් කරුණු වෙනුවෙන් ආරම්භක රටවල් වලින් ද ඉහත **i-Care** විමසීම් ක්‍රමය හරහා පැමිණිලි හා විමසීම් ලැබෙන අතර, ඒ පිළිබඳව තැපැල් මුලස්ථානයේ ජාත්‍යන්තර තැපැල් සේවා අංශය විසින් හෝ මධ්‍යම තැපැල් හුවමාරුවේ **EMS** විමසීම් අංශය විසින් තැපැල්/උප තැපැල් කාර්යාලයෙන් විමසන අවස්ථාවක දී ඒ පිළිබඳව විශේෂ අවධානය යොමු කර අදාළ තොරතුරු නොපමාව ලබා දීමට ක්‍රියා කල යුතුය.

### 11.2 තොරතුරු දැන ගැනීම සඳහා විමසීම්

පොදු කරුණු සඳහා වන තොරතුරු විමසීම් සඳහා : **1950**

EMS විමර්ශන සඳහා: 011-2320700 / 011-2440159

ජාත්‍යන්තර තැපැල් සේවා අංශය (IPS Division) තැපැල් මූලස්ථානය ඇමතීම සඳහා : 011-2320017 / 011-2328301 - 3 Ext 1201

අධිකාරී (ජාත්‍යන්තර තැපැල් සේවා) email ලිපිනය - supdt.ips@slpost.lk

සහකාර අධිකාරී (විශ්ව තැපැල් සංගම් කටයුතු) email ලිපිනය - asupu.ips@slpost.lk

IPS System පිළිබඳ තොරතුරු හා සහය ලබා ගැනීම සඳහා: ips.localsystem@slpost.lk

EMS භාණ්ඩ සඳහා වන තොරතුරු විමසීම් සඳහා:

EMS Center: 011-2447844, 011-2328644

email : ems@slpost.lk / ems.colombo@yahoo.com

චක්‍රලේඛ හා අත්පොත් බාගත කර ගැනීම සඳහා : e service Portal https://epay.slpost.lk/